# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,906 — 1970 මැයි 15 වැනි සිකුරාද — 1970.5.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන — — ... | 371 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 367 | මිළ පාලන දන්වීම ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 368 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම ... ... ... | 376 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 368 | ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 371 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දන්වීම් ... ... .. | 383 |
| | | " සුරාබදු ආඥාපනත " පිළිබඳ දන්වීම් ... ... | 384 |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 169**

අංකය : ඞ. 251/ආර්ඊසීපී/3.

### රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1968 ජූනි මස 15 වෙනි දින සිට උපදේශක ලුතිනන් කොමාන්ඩර් පදවියට.

උපදේශක ලුතිනන් පී. මහාදේව, රා.ලං.නා.හ.

2. 1970 මාර්තු මස 26 දින 14,899 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, 1970 අංක 105 දරණ නිවේදනය මෙයින් අවලංගු කෙරේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මැයි මස 2 දින,
කොළඹ දීය.

5-231

**1970 අංක 170**

අංකය : ඞී/වීඑෆ්/2/ඒ/(III)

### යුද්ධ හමුදාව—ලංකා සෙවච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1970 මාර්තු මස 16 වැනි දින සිට ලුතිනන්වරුන් වශයෙන් :—

දෙවැනි ලුතිනන් ආරච්චි පටබැඳිගේ දයාසේන එදිරිසූරිය, ලං.සා.හ.
දෙවැනි ලුතිනන් ලෙනාඩ් සමරසිරි මුණසිංහ, ලං.සා.හ.
දෙවැනි ලුතිනන් ශ්‍රියාන් විවේකානන්ද වනිගසේකර, ලං.සා.හ.
දෙවැනි ලුතිනන් ඇන්ටන් ශ්‍රිකාන්තන් මදුරනායගම්, ලං.සා.හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මැයි මස 4 දින,
කොළඹ දී ය.

5-280

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

**1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.**

**ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1970 අංක 171**

අංකය : ඩී/වීඑප්/10/ඒ (II)

### යුද්ධ හමුදුව—ලංකා සෙවච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

1970 මාර්තු මස 1 වැනි දින සිට පහත නම් සඳහන් පුද්ගලයින්, පිළිවෙලින් පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨත්වය ඇතිව, යුද්ධ හමුදුවේ සෙවච්ඡා බලසේනාවේ ලුතිනන් (උපකරණ පාලක) (කාර්මික) වශයෙන් අධිකාරියට පත් කිරීම සහ ඔවුන්ව ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය (සෙවච්ඡා) ඒකකයට ඇතුළත් කිරීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලදී.

1312 මාණ්ඩලික සැරයන් දොන් එදිරිසේන කොතලාවල

1397 සැරයන් තිරිමාන්නහෙට්ටිගේ දොන් විලී දිසානායක

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1970 අප්‍රේල් 29,
කොළඹ දී ය.

5-278

---

**1970 අංක 172**

අංකය : ඩී/වීඑප්/38 (III)

### යුද්ධ-හමුදුව-ලංකා සෙවච්ඡා බලසේනාව-අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක් සහ ඇතුළත් කිරීමක්

1970 අප්‍රේල් මස 1 වැනි දින සිට පහත නම සඳහන් මහතාව, යුද්ධ හමුදුවේ සෙවච්ඡා බලසේනාවේ දෙවන ලුතිනන්වරයෙකු වශයෙන් අධිකාරියට පත් කිරීම සහ ඔහුව ලංකා යුද්ධ හමුදා සේවා බලකාය (සෙවච්ඡා) ඒකකයට ඇතුළත් කිරීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් සතුටින් අනුමත කර ඇත.

රංජිත් ඇතුලත්මුදලි මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1970 මැයි මස 4 වන දින,
කොළඹ දී ය.

5-275

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 173**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝගකර ඇත :—

ඒ. 109/69.

ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. පත්මනාදන් මහතා 1970 පෙබරවාරි මස 22 වැනි දින සිට පළාත් පාලන අමාත්‍යාංශයේ වැඩ සටහන් සම්පාදන අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 109/69.

පළාත් පාලන අමාත්‍යාංශයේ වැඩ සටහන් සම්පාදන අංශයේ වැඩබලන අධ්‍යක්ෂ ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ඩබ්ලිව්. පත්මනාදන් මහතා 1970 පෙබරවාරි මස 22 වැනි දින සිට සිය රාජකාරිවලට අතිරේකව පළාත් පාලන අමාත්‍යාංශයේ ආයතන හා ගිණුම් අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ වැඩ බැලීමට.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මැයි මස 6 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 500,
කොළඹ 1.

5-245

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 174**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑම්./ජී. 40/66.

ඊ. ඒ. විජේකුලසූරිය මහතා 1970 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ (කුලියාපිටිය පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, කුරුණෑගල අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ (කුලියාපිටිය පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්./ජී. 40/66.

ආර්. සී. බී. ජයසේකර මහතා 1970 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66.

සී. එම්. තර්මලිංගම් මහතා 1970 මැයි මස 1 වැනි දින සිට 31 වැනි දින දක්වා හෝ නැවත නියමයක් කරන තුරු, අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ අවිස්සාවේල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අවිස්සාවේල්ල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/6/67.

ආර්. නවරත්නම් මහතා 1970 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ කොළඹ නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : සීජේපී/පී. 1/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා 1970 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, පේදුරුතුඩුවේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන සහ පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : සීජේපී/එස්. 30/63.

අයි. ජී. එන්. ද ජේ. සෙනෙවිරත්න මහතා 1970 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 35/48.

එස්. ජෝකනාදන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, කුරුණෑගල ම. උ. අංක 62207 සහ 59636 දරණ නඩුවල තීන්දු දීම පිණිස 1970 මැයි මස 4 දින සිට කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 18/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1970 අප්‍රේල් මස 30 දින බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 13/48 (1).

එම්. එම්. විජේසූරිය මහතා 1970 මැයි මස 2 දින සිට දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 12754/ඒ දරණ නඩුවේ දඬුවම් නියම කිරීම පිණිස, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල-ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජේ. 10/60.

එස්. ඩී. ජයසුන්දර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම්. එම්. මුස්තාපා මහතා 1970 මැයි මස 7 වැනි දින, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 31/65.

බී. එස්. බී. පී. ආර්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. එස්. ඒ. පෙරේරා මහතා 1970 අප්‍රේල් මස 30 දින සිට මැයි මස 2 දින දක්වා, කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභා සීමාව තුළ කනදුල්ලේ පිහිටි උසාවියේ සිට 20 වැනි දින දක්වා, මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/බී. 27/64.

එම්. බී. ජේ. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සිමම්පිල්ලේ මහතා 1970 මැයි මස 15 දින සිට 20 වැනි දින දක්වා, මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 28/63.

කේ. වී. ස්වර්ණාධිපති මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. බිඩ් පෙරේරා මහතා 1970 මැයි මස 2 දින කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එන්. 5/61.

බී. එස්. නෙත්සිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. නවරත්නරාජා මහතා 1970 මැයි මස 6 දින සිට 10 දින දක්වා, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 6/65.

ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඊ. කදිර්ගාමලිංගම් මහතා 1970 මැයි මස 6 දින සිට 9 දින දක්වා, යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 6/65.

ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. කනගරත්නම් මහතා 1970 මැයි මස 10 දින සිට 13 වැනි දින දක්වා, යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 28/65.

ජී. ජී. ඩී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එන්. ද සිල්වා මහතා 1970 මැයි මස 8 දින, පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 11/62.

සී. ඊ. මෙන්ඩිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එම්. විජේසූරිය මහතා 1970 අප්‍රේල් මස 27, 29 සහ 30 වැනි දිනයන් හී, කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල-ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 10/63.

ජී. ඒෆ්. එච්. අතුරුපාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. බොතේජු මහතා 1970 මැයි මස 2 දින සිට 4 වැනි දින දක්වා, කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල-ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 12/65.

ටී. එන්. අබේවීර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. චින්නයියා මහතා 1970 මැයි මස 15 දින සිට 23 දින දක්වා, කල්මුනේ ක්‍රියා කරන මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 24/59.

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. තියාගරාජා මහතා 1970 මැයි මස 3 දින සිට 6 දින දක්වා, මාතලේ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1970 අප්‍රේල් මස 24 දින සිට 26 දින දක්වා, ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 26/61.

ජේ. යෝනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, රෙක්ස් වික්‍රමසිංහ මහතා 1970 අප්‍රේල් මස 16 සහ 17 වැනි දිනයන්හි, ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 11/64.

එස්. ජේ. ඩී. ද එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ජේ. පීරිස් මහතා 1970 මැයි මස 1 දින සිට, බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ටී. 8/66.

සී. එම්. තර්මලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. රත්නසිංහම් මහතා 1970 අප්‍රේල් මස 30 දින, පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : සිආර්පී/එෆ්ජේ. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා 1970 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලේ සහ කුකුල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ නවදුන් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/එම්. 8/58.

එච්. එම්. එස්. බී. මඩවල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එම්. පටබැඳි මහතා 1970 අප්‍රේල් මස 16, 17 සහ 18 වැනි දිනයන් හී, තංගල්ල දිස්ත්‍රික්කයේ මාගම් පත්තුව, නැගෙනහිර ගිරුවා පත්තුව, උතුරු ගිරුවා පත්තුව සහ දකුණු ගිරුවා පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 7/59.

සුධර්මා ධර්මදාස මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ජේ. ඒ. විමලධර්ම මහතා 1970 අප්‍රේල් මස 18 වැනි දින අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ, පහළ බුලත්ගම, අටළුගම සහ පනාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ සහ කුරුවිටි කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 10/63.

පී. ජේ. එස්. ඒ. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්වින් ප්‍රනාන්දු මහතා 1970 අප්‍රේල් මස 30 වැනි දින, හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරලයන් හී ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 2/62.

සී. ඒ. එස්. ඊ. ක්‍රිස්පින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජී. සූරියආරච්චි මහතා 1970 අප්‍රේල් මස 29 වැනි දින සහ 30 වැනි දිනයන් හී, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති සහ ගල්ගමුව, නිකවැරටිය, කුලියාපිටිය, පන්නල, බිංගිරිය, හිරියාල හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශයන් හී අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඇම්. ජී. දිසානායක මහත්මිය 1970 මැයි මස 2 වැනි දින, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ සහ කුකුල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ නවදුන් කෝරලයේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 18/57.

එස්. එස්. එම්. ධිරරත්න මහතා 1970 අප්‍රේල් මස 24 වැනි දින සිට, දම්පහල ගම්බද උසාවියේ අංක 2399, 2342 සහ 5525 දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දු දීම පිණිස, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ වැලිගම් කෝරලේ සහ ගගබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒඒ/41/57.

ආර්වින් ප්‍රනාන්දු මහතා 1970 මැයි මස 17 වැනි දින සිට මාදම්පේ ගම්බද උසාවියේ අංක 9525 දරණ අපරාධ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස, පිටිගල් කෝරලේ උතුර සහ දකුණු ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එෆ්ජ. 3/64.

ඩබ්ලිව්. ඒ. බී. ඕ. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. යූ. කරවිට මහතා 1970 අප්‍රේල් මස 26 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු හුරුළු පළාත, දකුණු හුරුළු පළාත, මැද හුරුළු පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති සහ උතුරු කලාගම් පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හී අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එෆ්ජ. 3/66.

ඩබ්ලිව්. ඒ. බී. ඕ. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, මහින්ද බුලංකුලම මහතා 1970 අප්‍රේල් මස 27 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු හුරුළු පළාත සහ දකුණු හුරුළු පළාත, මැද හුරුළු පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති සහ උතුරු කලාගම් පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හී අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 13/69.

බී. එස්. වික්‍රමසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. යූ. කරවිට මහතා 1970 අප්‍රේල් මස 30 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත, දකුණ, උතුර, නැගෙනහිර සහ බස්නාහිර ආදායම් නිලධාරී කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/සී. 7/57.

ඇම්. ඇම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. සී. රාජපක්‍ෂ මහතා 1970 අප්‍රේල් මස 27 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති සහ හිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 5/56.

සී. බී. හුණුකුඹුර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඉන්ද්‍රානි එම්. එස්. ගොඩකුඹුර මෙනවිය, 1970 මැයි මස 8 වැනි දින, රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් සහ කොලොන්න කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 3/58.

සී. ඊ. ඒ. ගුණසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. එස්. රාජපක්ෂ මහතා 1970 මැයි මස 6 වැනි දින, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ, වල්පනේ සහ නුවර එළිය ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 4/68.

කේ. නාගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. ජබාර් මහතා 1970 අප්‍රේල් මස 21, 24, 25, 28 සහ 29 වැනි දිනයන් හී, කල්මුනේ දිස්ත්‍රික්කයේ කරවකු සහ නින්තවූර් පත්තු සහ වැව්ගම් පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 12/66.

පී. ඕ. ආර්. විජේතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, යසරත්න කරුණානායක මහතා 1970 මැයි මස 2, 3, 4, 12 සහ 14 වැනි දිනයන් හී, මාතර දිස්ත්‍රික්කයේ වැල්ල බඩ පත්තුව, කඩවත් සතර, වැලිගම් කෝරලේ කඳබොඩ පත්තුව සහ ගගබොඩ පත්තුව ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 5/61.

සී. ආර්. රාජසිංහම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඒ. අරසකෝන් මහතා 1970 අප්‍රේල් මස 24, 25, 26, 29, 30 හා මැයි මස 2, 3, 4 සහ 6 වැනි දිනයන් හී මඩකලපුව දිස්ත්‍රික්කයේ එරුවිල් පොරතිවු සහ දකුණු මාම් මුනෙයි පත්තු ගම්බද උසාවි සභාපති සහ උතුරු මාම්මුනෙයි පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එෆ්ජ. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඩබ්ලිව්. ඩී. එන්. වෙත්තසිංහ මහතා 1970 මැයි 3 වැනි දින, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලේ සහ කුකුල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ නවදුන් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මැයි මස 7 දා,
කොළඹ 12,
තැ. පෙ. අංකය : 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

5-346/1

---

**1970 අංක 175**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද ස්ථිර කිරීම් සහ අවලංගු කිරීම් :—

අංකය : සීජේපී/ඒ. 11/65.

ජේ. ජී. ආසිර්වාදම් මහතාගේ 1966 අප්‍රේල් මස 29 දින සිට ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් වූ ඔහුගේ පත්වීම් ස්ථිර කර ඇත.

අංකය : පීඑල්/එස්. 3/59.

ජී. නුගවෙල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඊ. ඉලංගන්තිලක මහතා 1970 මාර්තු මස 6 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර සහ උඩ දුම්බර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට දී ඇති පත්වීම මෙයින් අවලංගු කර ඇත.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මැයි මස 7 දා,
කොළඹ 12, තැ. පෙ. අංකය : 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

5-346/2

## වෙනත් පත් කිරීම් ආදිය

**1970 අංක 176**

පා 4/සාවි 4/39, පා 4/සාවි 9/71, පා 4/සාවි 9/104,
පා 4/සාවි 23/6, පා 4/සාවි 9/182, පා 4/සාවි 2/364,
පා 4/සාවි 1/28, පා 4/සාවි 9/189, පා 4/සාවි /නිල/47,
පා 4/සාවි 2/78, පා 4/සාවි 9/171, පා 4/සාවි 3/137,
පා 4/සාවි 2/367, පා 4/සාවි 5/17, පා 4/සාවි 16/48,
පා 4/සාවි 3/151, පා 4/සාවි 10/15, පා 4/සාවි 3/153,
පා 4/සාවි 4/38, පා 4/සාවි/නිල/2.

### අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක්සැන්ඩර් ෆේපයාර්ලි විජේමාන්න වන මම,

1. වීරතන්ත්‍රිගේ කැලික්ස්ටස් ඩයස් මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
2. නීතිඥ එම්. ඒ. එස්. මරික්කාර් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,
3. කරුපයියා ආරුමුගම් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
4. කන්දානේගේ පුංචි බණ්ඩා මහතා වවුනියාව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
5. අඩයප්පයලෑ ගෙදර අබ්දුල් කාදර් හජ්ජියාර්ගේ පුත් මොහමඩ් යුසුප් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
6. මොහමඩ් ජබීර් අබ්දුල් කාදර් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
7. මුතු සන්ගරලිංගම් සෙල්ලසාමි මහතා දිවයිනේ සියළුම අධිකරණ දිස්ත්‍රික්ක සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
8. පහළ රබ්බේගමුවේ ගෙදර ජයතිලක මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
9. අධිනීතිඥ පී. සී. ද සිල්වා මහතා ධීවර දෙපාර්තමේන්තුවේ කළමනාකාර නිලධාරී ධූරය දරණතාක් කල් දිවයිනේ සියළුම අධිකරණ දිස්ත්‍රික්ක සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
10. වෙල්ලසාමි ෂන්මුගරාජා මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයනේ ද,
11. රාජවිච්ක වෙල්ලාල ඉඩංගෙදර අමරදාස සේනාරත්න මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
12. පල්ලියරාලලාගේ දොන් පෝල් මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
13. අබ්දුල් රහමන් මොගමඩ් උලියාස් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
14. මන්තිරි පෙරුමන් සුන්දරම් මහතා බස්නාහිර පළාතේ සියළුම අධිකරණ දිස්ත්‍රික්ක සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
15. මොහම්මදු ඉස්මායිල් මහල්ලම් මොහම්මදු සාලි මහල්ලම් මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
16. මද්දුම බණ්ඩාරගේ දොන් සීමන් කරුණාරත්න මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
17. නීතිඥ වේලාඋදම් විජයසුන්දරම් මහතා නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
18. කාසිම් මරික්කාර් අබ්දුල් කපූර් හජ්ජියාර් මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
19. විජේරත්නම් ජෙයරත්නම් මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
20. ඊ. ඩබ්ලිව්. ජයවර්ධන මහතා මහනුවර, ජාතික නිවාස සහකාර කොමසාරිස් ධූරය දරනතාක් කල්, මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයකු වශයෙන් ද,

පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 මැයි මස 8 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

5-333/1

---

### නිවැරදි කිරීම

අංකය : පා 4/සාවි 14/76

1970 අප්‍රේල් 24 වැනි දින අංක 14,903 දරන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 326 වැනි පිටුවේ 1970 අංක 144 දරණ දැන්වීමේ "(3) මොරම්පිටිය හේවාගේ හෙන්රි ආරියරත්න මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද," යන්න වෙනුවට "(3) මොරපිටිය හේවා හෙන්රි ආරියරත්න මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද," යන්න ආදේශ කිරීමෙන් ද,

අංකය : පා 4/සාවි 18/19

1970 අප්‍රේල් 24 වැනි දින අංක 14,903 දරණ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 326 වැනි පිටුවේ 1970 අංක 144 දරණ දැන්වීමේ "(1) වනසිංහ මුදියන්සේලාගේ කලයාණපාල අබේගුණවර්ධන මහතා නංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද," යන්න වෙනුවට "(1) වනසිංහ මුදියන්සේලාගේ කලයාණ පාල අබේගුණවර්ධන විරසිංහ මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද" යන්න ආදේශ කිරීමෙන් ද,

අංකය : පා 4/සාවි 26/6.

1970 අප්‍රේල් 10 වැනි දින අංක 14,901 දරන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 277 වැනි පිටුවේ 1970 අංක 133 දරන දැන්වීමේ "(1) කතිරනම්බි සුබ්‍රමානියම් සිත්තරවේලු මහතා ත්‍රිකුණාමලය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද," යන්න වෙනුවට "(1) කතිරි තම්බි සුබ්‍රමනියම් සිත්තිරවේළු මහතා තිරිකුණාමලය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද" යන්න ආදේශ කිරීමෙන් ද සංශෝධනය කරනු ලැබේ.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 මැයි 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

5-333/2

---

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.—බී.129/47 අංක : සී. 39/8/66

### 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාව

**61 වන වගන්තිය යටතේ ආඥාව**

1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 61 වන වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද ආඥාව.

ඩී. ආර්. එල්, බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මැයි මස 2 වැනි දින,
කොළඹ දීය.

අංක 196 දරන ආඥාව

1. වර්ෂයකට විශ්‍රාම වැටුප් හිමි වේතන රු. 2,700 ට වැඩි නොවන හෝ විශ්‍රාම වැටුප් අහිමි වේතන රු. 3,180 ට වැඩි නොවන, මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් වෙළඳ නැව් දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකුට තරවටු කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ සතියක වැටුපට වැඩි නොවන දඩයක් පැනවීමේ බලය, එම උපලේඛනයේ

II වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන ඒ දෙපාර්තමේන්තුවේ නිලධාරියාට හෝ නිලධාරීන්ට, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මෙයින් පවරාදෙනු ලැබේ.—

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කළ හැකි උපදෙස් අනුව එම බලතල ක්‍රියාවේ යෙදවිය යුතුය.

(ආ) මේ ආඥාව යටතේ පවරනු ලැබූ යම් බලයක් අනුව එවැනි නිලධාරියෙකු විසින් කරනු ලැබූ තීරණයක් පිළිබඳව සෑහීමට පත් නොවූ යම් තැනැත්තකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනයක් ඉදිරිපත් කළ හැකිය.

(ඇ) නිලධාරියෙකුට පවරනු ලැබූ දඬුවම් දීමේ යම් බලයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාවේ යෙදවිය යුතුයයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් අවස්ථාවකදී, එම බලය ඒ නිලධාරියා විසින් එම අවස්ථාවේදී ක්‍රියාවේ යෙදවීම නොකළ යුතුය.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනය කිරීම සඳහා 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 61 වෙනි වගන්තියෙන් පැවරුණු අයිතිවාසිකම් හීන කිරීමක් හෝ ඒ අයිතිවාසිකම් කෙරෙහි අන් ලෙසකින් බලපෑමක් හෝ මේ ආඥාවෙහි සඳහන් කිසිවකින් සිදු වෙතැයි නොසැලකිය යුතුය. නැතහොත් එලෙස තේරුම් නොගත යුතුය.

### උපලේඛනය

| I තීරය | II තීරය |
|---|---|
| II වැනි ශ්‍රේණියේ විධායක ලිපිකාර පන්තියේ නිලධාරීහු හා සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියේ නිලධාරීහු | ෂිපිං මාස්ටර් |
| ලඝුලේඛකයෝ ... | ෂිපිං මාස්ටර් |
| යතුරු ලේඛකයෝ ... | ෂිපිං මාස්ටර් |
| ටැලිපෝන් ක්‍රියාකරුවන් ... | ෂිපිං මාස්ටර් |
| කාර්යාල කාර්ය සහායකවරුන් ... | ෂිපිං මාස්ටර් |
| කම්කරු ... ... | ෂිපිං මාස්ටර් |
| සහකාර සමීක්ෂක ... | ඉංජිනේරු සහ නැව් සමීක්ෂක ෂිපිං මාස්ටර්<br>සහකාර ඉංජිනේරු සහ නැව් සමීක්ෂක |

5–345

---

එල්.ඩී. — බී. 24/51.

## මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ 190 සහ 237 වන වගන්ති යටතේ ප්‍රවාහණ ඇමතිවරයා විසින් පනවනු ලැබේ. මෙම නියෝගය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ දී සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ දී අනුමත කර ඇත.

ඊ. එල්. බී. හුරුල්ලේ,
ප්‍රවාහන ඇමතිවරයා.

1970.5.2,
කොළඹ.

### නියෝග

පසුව සංශෝධිත පරිදි, 1952 පෙබරවාරි මස 27 අංක 10,360 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ, පළ කරන ලද 1951 මෝටර් වාහන (කුලී මෝටර් රථ සහ බස් රථ) නියෝග මැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි II වන කොටසේ, 27 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :—

"27 අ. (1) කුලියට දෙන හෝ කුලී සඳහා ධාවනය කරන සෑම මෝටර් කැබ් රථයකම අයිතිකරුවකු විසින් පහත දක්වෙන තොරතුරු අඩංගු ලොග් පොතක් තබා පවත්වාගෙන යා යුතුය.

(අ) කැබ් රථය ලියාපදිංචි කිරීමේ අංකය, එහි වර්ගය, චැසි අංකය සහ ඇන්ජිමේ අංකය ;

(ආ) රියැදුරාගේ නම සහ ඔහුගේ රියැදුරු බලපත්‍රයේ අංකය ;

(ඇ) දවසේ වැඩ ආරම්භ කළ සහ අවසන් කල වේලාව ; සහ

(ඈ) කැබ් රථය අලුත්වැඩියා කිරීමට යම් කාලයක් ගත කලේ නම් එම කාලය.

(2) කුලියට දෙන හෝ කුලී සඳහා ධාවනය කරන මෝටර් කැබ් රථයක රියැදුරකු විසින් පහත දැක්වෙන ලියකියවිලි එම රථයේ ගෙනයා යුතු ය ;

(අ) මෝටර් වාහන පරීක්ෂකයකු විසින් කැබ් රථය සඳහා නිකුත් කරන ලද වලංගු යෝග්‍යතා සහතිකයක් ; සහ

(ආ) "කැබ් රථයට සවිකොට ඇති ටැක්සි මීටරය සම්බන්ධයෙන් කොමසාරිස් වරයා විසින් නිකුත් කරන ලද වලංගු නිරවද්‍යතා සහතිකයක්.

(3) එහි IV වන කොටස් 35 වන නියෝගයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :—

"35 අ. විධිමත් සේවයක් සඳහා යොදවා ඇති බස් රථයක ගමන් කරන මගියකු නාගරික ප්‍රදේශයකදී පහත දැක්වෙන ස්ථානවල, එනම්—

(අ) බස් රථය සඳහා සපයන ලද හෝ වෙන් කරන ලද ඒ ස්ථානයෙහි ප්‍රදර්ශනය කර ඇති උචිත දැන්වීමකින් ඒ බව දැක්වෙන නැවතුම් පොළක ; හෝ

(ආ) බස්රථ සඳහා සපයන ලද හෝ වෙන් කරන ලද හා ඒ ස්ථානයෙහි ප්‍රදර්ශනය කර ඇති උචිත දැන්වීමකින් ඒ බව දැක්වෙන පොදු වාහන නැවතුම් පොළක ; හෝ

(ඇ) බස්රථ සඳහා වෙන් කරන ලද හා පනතේ 166 වන වගන්තිය යටතේ දැන්වීමකින් ඒ බව පෙන්වා ඇති රථවාහන නැවතුම් පොළක ; හෝ

(ඈ) බස්රථය ක්‍රියා විරහිත වූ අවස්ථාවක හෝ හදිසි අවස්ථාවක දී ; හෝ

(ඉ) යම් ස්ථානයක, බස්රථය නැවැත්වීමට කොමසාරිස් විසින් බලය දෙමින් නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් බස්රථයේ රියැදුරා සතුව ඇත්තේ යම් ස්ථානයක් වෙනුවෙන් ද ඒ ස්ථානයෙහි හැර බස් රථයෙන් නොබැසිය යුතුය".

5-206

---

එල්.ඩී.—බී. 6/52.

## මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 166 (2) සහ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන ඇමතිවරයා විසින්, මාතර නාගරික සභා පාලන සීමාවන් තුළ වූ ප්‍රදේශය සඳහා සම්පාදනය කරන ලද නියෝගය. මෙම නියෝගය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේදී අනුමත කර ඇත.

ඊ. එල්. බී. හුරුල්ලේ,
ප්‍රවාහන ඇමතිවරයා.

1970.5.2,
කොළඹ.

### නියෝගය

මෙහි උපලේඛනයේ නියම කොට ඇති ප්‍රසිද්ධ නැවතුම් පොළක හැර මාතර නාගරික සභා පාලන සීමාවන් තුළ කිසිම මහා මාර්ගයක කුලී මෝටර් රථයක් හෝ ටැක්සි රථයක් නවතා නොතැබිය යුතු ය.

### උපලේඛනය

1. පහත දැක්වෙන පරිදි මායිම් වූ මාතර පාලම සහ බස් නැවතුම් පොල අසල (අංක 1 නැවතුම්පොළ) ඇතුළත් වන ප්‍රදේශය :—

උතුරින් : නිල්වලාගඟ ;
දකුණින් : කොටුවට යන මාගී සීමාව ;
නැගෙනහිරින් : මාතර හම්බන්තොට පාර ;
බස්නාහිරින් ; ළමා උද්‍යානය.

2. පහත දැක්වෙන පරිදි මායිම් වූ කොටුවේගොඩ ප්‍රසිද්ධ වෙළඳ පොල ඇතුළත් වන ප්‍රදේශය :—

උතුරින් : පල්ලිමුල්ල පාර ;
දකුණින් : වෙළඳපොල සීමාව ;
නැගෙනහිරින් : වෙළඳපොල පාර ;
බස්නාහිරින් : වෙළඳපොලට ළඟාවන පාර.

5-207

---

ඇල්. ඩී.—බී. 101/45

## පුරාවස්තු ආඥාපනත

(188 වැනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 33 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා කොමසාරිස්, රාජේන්ද්‍ර හේමපාල ද සිල්වා වන මම, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් රජයේ එක් එක් බිම් ප්‍රදේශය ඒ ආඥාපනතේ කාර්යයන් සඳහා පුරාවිද්‍යාත්මක කටයුතුවලට වෙන්කළ බිමක් වියයුතු බව මෙමෙ නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

රාජා ද සිල්වා,
පුරාවිද්‍යා කොමසාරිස්.

1970 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

(1) සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, බටහිර අටුළුගම් කෝරළයේ වැලිවිටිය නමැති ගමේ පිහිටි අංක ඒ 598 දරන මූලික පිඹුරේ 1, 2 හා 3 යන බිම් කැබලි වශයෙන් පෙන්නුම් කර ඇති අක්කර 0, රූඩ් 2, පර්චස් 9.2 ක වපසරිය ඇති ඉඩම් කට්ටිය.

(2) වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නිහත්පත්තුවේ කටුවන්නා කෝරළයේ කුඩා කටුවන්නාව නමැති ගමේ පිහිටි අංක 2381—2381 සී දරන අවසාන ගම් පිඹුරේ 1 වැනි අතිරේකයේ 96 වැනි බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කර ඇති අක්කර 1, රූඩ් 2, පර්චස් 39.7 ක වපසරිය ඇති ඉඩම් කට්ටිය.

5-194

---

අංකය : සී/අයි 117.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 හා සීමාසහිත ගෝර්ඩන් ෆ්‍රේසර් සහ සමාගම, තැ. පෙ. 65, කොළඹ අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහමඩ් හනීපා මොහමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශෙෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 6, කොලින්වුඩ් පෙදෙස, අංක 22 හි ඩබ්. ඩී. තාමෝදරම් මහතා මෙයින් පත් කරනු ලැබේ.

ඇම්. එච්. මොහමඩ්.
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය,
71, මැලේ වීදිය,
කොළඹ 2

සහ

සීමාසහිත ගෝර්ඩන් ෆ්‍රේසර් සහ සමාගම,
තැ. පෙ. 65, කොළඹ

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය සහ සීමාසහිත ගෝර්ඩන් ෆ්‍රේසර් සහ සමාගම අතර ගෝර්ඩන් ෆ්‍රේසර් සමාගම විසින් සේවයේ යොදවා සිටින, ඉහත කී සමිතිය විසින් තම සාමාජිකයන් වෙනුවෙන් කර ඇති පහත දක්වෙන ඉල්ලීම් සම්බන්ධයෙන් කාර්මික ආරාවුලක් පවතී. එම ඉල්ලීම් නම් :—

(1) බයිසිකල් හෝ කුඩ හෝ වැහි කබා, කොටස් වශයෙන් ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීමට පහසුකම් සැලසීම.

(2) හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනය සඳහා එක් සේවකයෙකුට රු. 500 බැගින් ණය මුදල් ගෙවීම.

(3) සියළුම සේවකයන්ට නිල ඇඳුම් සැපයීම.

(4) සේවකයෙකුගේ හෝ ඔහුගේ පවුලේ අයෙකුගේ අභාවයේ දී සේවකයෙකුට රු. 350 බැගින් අවමංගලාධාර මුදල් ගෙවීම.

(5) අවුරුද්දකට වරක් ආගමික වැදගත්කමක් ඇති ස්ථානයක් බැලීමට යාම සඳහා ගමන් පහසුකම් සහ අනෙක් පහසුකම් සැලසීම.

(6) සෑම සේවකයෙකුටම අවුරුදු පතා එක් මසක ඒකාබද්ධ වැටුප් පාරිතෝෂික දීමනා වශයෙන් ගෙවීම.

(7) බී. ඒ. ඩී. ඒමිස් සිංඤෝ මහතා සහ පී. මාර්ටින් මහතා වෙත නිකුත් කරන ලද අවවාද කිරීමේ ලිපි අස්කර ගැනීම.

(8) අවුරුද්ද තුළදී ලබා නොගන්නාලද වෛද්‍ය නිවාඩු ඊළඟ වර්ෂයේ දී දීම.

(9) තේ පෙට්ටි ගොඩගැසීමේදී පෙට්ටි 5කට වඩා උසින් තබන පෙට්ටි සඳහා එක් එක් තේ පෙට්ටිය සඳහා ශත 5 බැගින් අතිරේක ගෙවීමක් කිරීම.

(10) 1967 වර්ෂය සඳහා පැමිණීමේ පාරිතෝෂික දීමනාවක් ගෙවීම.

1970 අප්‍රේල් මස 2 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. ඇල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

5-160

---

මගේ අංකය : ඊ 23/කො 489/67.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (2) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය කම්කරු කොමසාරිස්වරයාගේ අනුබද්ධිත ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කම්කරු කොමසාරිස් තැනගේ ප්‍රකාශනයේ සඳහන් වන පුද්ගලයන් 229 වෙනුවෙන් පෙනී සිටින අයි. ඒ. ඩී. එල්. ඩබ්ලිව්. ගුණරත්න මහතා, 170, ස්ටේෂන් පාර, නුගේගොඩ, වී. ද එස්. වික්‍රමසිංහ මහතා, 21/43, මරදාන පාර, හැඳල සහ කේ. ඩී. ඇල්ප්‍රඩ් මහතා, මාපිටිය, දියලගොඩ, මග්ගොන, එක් පාර්ශ්වයක් වශයෙන්ද අනෙක් පාර්ශ්වය වශයෙන්ද සීමාසහිත ලංකා සමුපකාර මසුන් වෙළඳ සංගමය, 127, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14, අතර කාර්මික ආරාවුලක් පවතී.

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහමඩ් හනීපා මොහමඩ් වන මම 1957 අංක 14, අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල නිරවුල් කිරීම සඳහා එම පනතේ 22 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන්නා වූ කාර්මික අධිකරණයක් වෙත යොමු කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය—කාර්මික ආරාවුල් පනත

(i) නුගේගොඩ, ස්ටේෂන් පාරේ අංක 170 හි, අයි. ඒ. ඩී. ඇල්. ඩබ්ලිව්. ගුණරත්න, (ii) හැඳල, මරදාන, පාරේ අංක 21/43 හි, වී. ද එස්. වික්‍රමසිංහ, (iii) මග්ගොන, දියලගොඩ, මාපිටියේ කේ. ඩී. ඇල්ප්‍රඩ් යන අය විසින් නියෝජනය කෙරෙන උපලේඛනයේ නම් සඳහන් වන 229 දෙනා එක් පාර්ශ්වයක් වශයෙන් සහ අනික් පාර්ශ්වය වශයෙන් කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් පාරේ අංක 127 හි, සීමාසහිත ලංකා සමුපකාර මසුන් වෙළඳ සංගමය අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල නම් අමුනා ඇති උපලේඛනයේ නම් සඳහන් වන 229 දෙනා සීමාසහිත ලංකා සමුපකාර මසුන් වෙළඳ සංගමයට කරන ලද සේවය සඳහා

පාරිතෝෂික දීමනා ගෙවන සේ ඉල්ලීම යුක්ති සහගතද, එසේ නම් ඔවුන් එකිනෙකාට කුමණ සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1970 අප්‍රේල් මස 22 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්වරයාගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

### උපලේඛනය

1. එච්. ඇස්. බී. ගිරිගෝරිස්
2. ජේ. පීටර්
3. පී. ආර්. ද මෙල්
4. ඕ. ඩී. ඔගොස්තීන්
5. ඒ. ජී. ධර්මදාස
6. ආර්. අමරසේන
7. ඇස්. ඩී. ඩබ්ලිව්. ධම්සේන
8. ඇන්. ආර්. සී. මොරල්
9. කේ. පී. පියදාස
10. ඇන්. ඩී. තෝමිස්
11. සී. පී. සෞන්දරනායගම්
12. කේ. ජී. පීටර්
13. ඩබ්. ඇස්. පෙරේරා
14. ජී. ඩී. පී. ජයතිලක
15. ඇල්. ඩබ්ලිව්. ගුණරත්න
16. ජී. ධර්මදාස
17. ඩබ්ලිව්. ඒ. පීටර්
18. එච්. ඊ. ද සිල්වා
19. එච්. සී. එච්. පෙරේරා
20. පී. ඩබ්ලිව්. මෙන්ඩිස්
21. ඇස්. ඒ. ඩී. විල්සන්
22. ඩබ්ලිව්. ඩී. ද අල්විස්
23. කේ. ඩී. ඇල්. ආර්. විජේසේකර
24. ආර්. ඒ. විල්සන්
25. ඇන්. කේ. විල්බට්
26. පී. ඇන්. කුලසූරිය
27. ඇස්. ආර්. සිල්වා
28. ඇල්. ඇම්. වීරසිංහ (මිය.)
29. ඇම්. ආර්. සිල්වා
30. ඩී. ඇස්. විජේසිංහ
31. ඒ. ඇම්. ඒ. දයානන්ද
32. ඇස්. කේ. කරෝලිස්
33. කේ. ඩී. ඇල්ප්‍රඩ්
34. ආර්. ඊ. සොයිසා
35. ඒ. ඇල්. ජයතිලක
36. ඇන්. ඊ. ප්‍රනාන්දු
37. ඊ. පී. පී. ජයසූරිය
38. ඇම්. ඒ. ජේ. කුලරත්න
39. ඩී. ජී. විජේසිංහ
40. ඩී. ආර්. හෙට්ටිආරච්චි (මිය.)
41. ඇස්. විජේසිංහ (මිය.)
42. ඩී. පී. සෝමපාල
43. ජී. ඇස්. බ්‍රිටෝ
44. සී. කෝටෙලින්
45. ඩබ්. ඇම්. ආනිස්
46. ජී. බී. ප්‍රනාන්දු
47. ඇන්. පීරිස් (මිය.)
48. කේ. ඩී. පී. රිටා (මෙනෙවිය)
49. පී. ඇෆ්. ප්‍රනාන්දු
50. ඒ. ඩී. අල්පේනිස්
51. ජේ. ඒ. විල්සන්
52. එම්. ඩබ්ලිව්. ප්‍රේමරත්න
53. ඒ. හෙට්ටිහේවා
54. ඩබ්ලිව්. පොඩි අප්පුහාමි
55. ඇන්. ජී. ජීමෝ සිංඤෝ
56. ඊ. ඒ. සවරියෙල් සිංඤෝ
57. ඩබ්. එච්. ඩයස්
58. ආර්. ඇස්. හේරත්
59. පී. වී. ගුණසේන
60. ටී. ජේ. ප්‍රනාන්දු
61. ඇස්. ජිනදාස
62. ජේ. ඒ. ප්‍රැන්සිස්
63. කේ. ඇස්. පෙරේරා
64. කේ. බී. ජයවීර
65. ඩබ්. බී. ද සිල්වා
66. ඇස්. තන්ගරාජා
67. පී. ඒ. දාන් සිංඤෝ
68. ඇස්. විවේකානන්දරාජා
69. ඇම්. එච්. ජයරත්න
70. ඇම්. ආරොන් සිංඤෝ
71. පී. සිරිසේන
72. ඇම්. ඩී. සිරිසේන
73. ඇන් .ඒ. ඩී. මැල්කැඩියස්
74. ඇම්. ඩී. පීටර්
75. ඒ. ටී. ජේ. බැස්චියන් පිල්ලෙයි (මෙනෙවිය)
76. ඇස්. ඒ. ඩී. එඩ්වින්
77. සී. අයි. ඩී. ඇන්තනි
78. ඇම්. ඩී. පියසේන
79. පී. ඩයස්
80. ඇස්. කේ. ආරියරත්න
81. කේ. ඒ. ග්‍රේරෝ
82. එච්. සේනාධීර
83. ඇස්. මුතුලින්ගම්
84. පී. ඩී. ජී. පතිරණ
85. ඇම්. එච්. සිරිපාල
86. කේ. ඊ. ඇන්. පීරිස්
87. ඇල්. ඩබ්. ගුණවර්ධන
88. ඇන්. ඩී. ඔදිරිස්
89. ඩබ්. සිරිල් පෙරේරා
90. ඇස්. කේ. පතිරත්න (මෙනෙවිය)
91. වී. කුමාරස්වාමි
92. ඇස්. සෙගරාජසේකර
93. ඇස්. පොන්නදුරෙයි
94. ජී. කේ. ඒ. ගුණදාස
95. එච්. ජේ. විජේසුන්දර
96. ජී. සෙනෙවිරත්න
97. ආර්. ජේ. ප්‍රනාන්දු
98. කේ. ධර්මදාස
99. කේ. ඇම්. වේලු
100. යූ. ඒ. පුංචිසිංඤෝ
101. ඇම්. ඇල්. ඩයස්
102. ආර්. එච්. ගුණදාස
103. යූ. ඩී. විජේසිංහ
104. ටී. ජෝශප්
105. ඇම්. කන්දසාමි
106. ඇම්. රන්ජිත් කුරේ
107. එච්. ඒ. ඇස්. ගුණරත්න
108. ආර්. ඇම්. ජයරත්න
109. එච්. ඒ. බුද්ධදාස
110. ඇන්. ගුණරත්න
111. ආර්. ඒ. ඇම්. ද අල්විස්
112. කේ. ඇම්. පුංචි බණ්ඩා
113. ඇෆ්. දිසානායක
114. ආර්. පී. සිරිසේන
115. වී. ඩී. ඇස්. වික්‍රමසිංහ
116. ඇම්. රාජකුරේ
117. ඩබ්. ආර්. සෝමවීර
118. ඒ. සෙල්වරත්නම්
119. වී. පෙරේරා
120. සී. නන්දසිරි පෙරේරා
121. ටී. වේලනායගම්
122. කේ. ඩී. ජී. ජැනට් (මෙනවිය)
123. පී. සිරිල් සිල්වා
124. ඕ. ඩී. ඩේවිස්
125. ඇම්. ඇල්. බොතේජු
126. ඇම්. වී ආරියසේන
127. ඇල්. ඩී. ජයසේකර
128. ඇප්. ඒ. ද ඉසෙඩ්. විජේවර්ධන
129. ඇම්. ගුණසේන
130. ඒ. විටර්බුන්
131. එච්. ඇම්. ඉන්ද්‍රසේන
132. ඇන්. ඩබ්. ජී ලෝරන්ස්
133. ජේ. ඇම්. ඇෆ්. ප්‍රනාන්දු
134. ඇස්. හෙන්දවිතාරණ
135. ඇස්. ටී. ඇම්. ජවහර්ලාල්
136. යූ. ඒ. සිරිසේන
137. ඇම්. ආරියවංස (මෙනෙවිය)
138. ටී. ඇන්. පෙරේරා
139. ජේ. ඩී. රත්නපාල
140. කේ. ඇම්. කේ. ද අල්විස්
141. එච්. ඇස්. මාලිනී (මෙනෙවිය)
142. ඒ. ජෝශප්
143. ඇල්. ඩබ්. විල්බට්
144. ජී. ඩී. ඒ. පී. ලියනගේ
145. වී. විජේරත්න
146. ඇස්. ජේ. පීරිස්
147. ඇම්. බී. සිවජෝති
148. ආර්. බැස්තියන් පිල්ලෙයි (මෙනෙවිය)
149. ජී. සී. ලියනගේ
150. ඇම්. ජී. වී. පීරිස්
151. එච්. ජී. පී. ඇන්. පොන්සේකා
152. ඒ. ඇන්. ප්‍රනාන්දු
153. කේ. ටී. පී. රාජකරුණා
154. සී. අබේරත්න
155. ජී. ඇන්. කමලසූරිය
156. ඒ. ඇම්. ඇස්. බණ්ඩාර
157. ඩී. ඇම්. විජේදාස
158. ඩී. ඇලොයි පෙරේරා
159. ඇන්. කුරේරා
160. ඇම්. ඩබ්. කෝම්වතී (මෙනෙවිය)
161. ඩී. ලූටර්ස් (මෙනෙවිය)
162. යසපාල පෙරේරා
163. කේ. ඩී. ප්‍රේමදාස
164. ආර්. ජේ. විජේරත්න
165. ජී. ඒ. ආරියරත්න
166. එල්. එච්. ඇන්. ද සිල්වා (මෙනෙවිය)
167. ජී. ඒ. අමරදාස
168. කේ. ඇස්. ඇල්. පෙරේරා
169. ඩබ්. ඇම්. මහීපාල
170. කේ. ඩී. සිරිපාල
171. ඇල්. ද සිල්වා
172. එච්. සයිමන්
173. නෝමන් ද සොයිසා
174. කේ. ජී. නන්දසේන
175. ඩී. ඒ. ආරියරත්න
176. සී. පී. ගුණතිලක
177. ඇස්. ඩෙවෝවා
178. පී. පලයන්ගොඩ
179. ඩබ්. ඒ. යූ. පෙරේරා
180. කේ. ඒ. පියදාස
181. ආර්. කේ. සෝමපාල
182. ඇම්. ඒ. ඩබ්ලිව්. කුලරත්න
183. ජී. ඩී. ජේම්ස් සිංඤෝ
184. ඇල්. වයි. ජී. සිල්වා
185. ජෝකිනු අප්පු
186. නාගර් තම්බි
187. ආර්. ඒ ජෝශප් ඇන්තනි
188. ඇම්. ඇස්. කුරේ
189. ඇල්. ලුවිස් පෙරේරා
190. ආර්. ඒ. රෝගුස් අප්පු
191. ඒ. අලගයියා
192. බර්නාඩ් සිල්වා
193. ඩබ්ලිව්. පී. සිල්වා
194. ඇම්. ඇල්බර්ට්
195. ඇම්. ඩයස්
196. ජී. ජයවීර
197. ඇල්. ඒ. සේනන්
198. ජී. ලීලසේන
199. ඒ. ජී. මෙන්ඩිස්
200. ඇන්ඩම් ලෙබ්බෙ
201. ඇස්. බදුර්දීන්
202. සිනි තම්බි
203. සී. ඒ. කෝස්තා

204. ජී. ඇම්. ගුණපාල
205. මිස්කින් බාවා
206. පී. සන්තියාගෝ
207. ඩබ්. බෙනඩික්ට් ප්‍රනාන්දු
208. දියෝනිස් මැන්ඩෙලි
209. සුසායි ඇන්තනී
210. කේ. වැලන්ටයින්
211. වී. සිල්වා
212. ඇස්. කේ. ජෝශප්
213. එඩ්ගා විජේකෝන්
214. ජේ. පෙරේරා
215. ඒ. සිම්සන් සිල්වා
216. ජී. පී. පොන්සේකා
217. බී. ඇස්. බෙනඩික් තිසේරා
218. එච්. ජෝශප් ප්‍රනාන්දු
219. ලෙස්ලි කෲස්
220. ඩබ්. ඇස්. ප්‍රනාන්දු
221. ජෝශප් බෙනඩික්
222. මැක්මින්
223. ඇම්. ඇලෝසියස්
224. පී. පීරිස්
225. වින්සන්ට්
226. බී. මයිකල් ප්‍රනාන්දු
227. බී. ඒ. ලූකස්
228. කේ. එම්මානුවෙල්
229. බර්ට් ඇන්තනී

5-192

---

අංකය : සී/අයි 1.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

**4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය, 67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10 හා මහ නගර සභාව, කොළඹ අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහමඩ් හනීපා මොහමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 5, මායා ඇවනිව්, අංක 177 හි ඒජ්. ඊ. අලස් මහතා මෙයින් පත් කරනු ලැබේ.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹදී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය,
අංක 67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10

සහ

කොළඹ මහ නගර සභාව, කොළඹ

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

**ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය, සහ කොළඹ මහ නගර සභාව අතර පවතින කාර්මික ආරාවුල නම්, එකී සමිතියේ පහත නම් සඳහන් වන එක් එක් සාමාජිකයාට අතිකාල වැඩ කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව, කොළඹ මහ නගර සභාව විසින් රු. 10 බැගින් දඩ ගැසීම යුක්ති සහගතද නොඑසේ නම්, එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ:—

කේ. ඒ. සෝමසිරි මහතා (1301)

සිරිසේන මහතා (1391)

ආර්. ජී. ගුණපාල මහතා (932)

බන්දුසේන මහතා (3531)

දියෝනිස් අප්පු මහතා (1485), සහ

යූසුප් මහතා (1373)

1970 අප්‍රේල් මස 10 වැනිදාවූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. ඇල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

5-284

# ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම

## 1.—1969 දෙසැම්බර් 31 වැනි දිනට පැවැති ලැබීම් හා ගෙවීම්වලට එක එල්ලේම සම්බන්ධ , රජයේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

### බැරකම් සහ බැර ශේෂ

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල :— | | | |
| වල ණය— | | | |
| භාණ්ඩාගාර බිල්පත් ... ... ... | | 1,73,56,64,915 70 | |
| අයබදු සංචිත සහතික ... ... ... | | 1,59,31,676 15 | |
| ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අත්තිකාරම්— | | | |
| (i) මුදල් නීති පනතේ 89 වැනි වගන්තියේ ප්‍රකාර රජයේ ක්‍රියාකාරිත්වය ... ... | 21,75,99,952 25 | | |
| (ii) ජාත්‍යන්තර මුදල් අරමුදලේ, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ හා ආසියානු සංවර්ධන බැංකුවේ දයක මුදල් ගෙවීම සඳහා විශේෂ ණය මුදල් ... | 8,94,58,332 72 | | |
| | | 30,70,58,284 97 | |
**4. ටෙන්ඩර් තැන්පත් මුදල සහ වටිනාකම් සහතිකය.**—(1) අවශ්‍ය යයි පෙනී ගියහොත් එක් එක් ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් ටෙන්ඩර් කරු විසින් රුපියල් තුන් දහසකට (රු. 3,000 කට) වැඩි නොවන මුදලක් තැන්පත් කළ යුතු යයි රජයේ දිසාපති විසින් නියම කළ හැකිය. එයද මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම සඳහාය යි" ලකුණු කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් අධ්‍යක්ෂක චෙක් යන ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමටම ලියන ලද චෙක්පතකින් තැන්පත් කර තිබිය යුතුය.

(2) මේ කොන්දේසියේ පූර්වෝක්ත ඡේදය යටතේ රජයේ දිසාපති විසින් නියම කරනු ලබන මුදල තැන්පත් කළ බවට කච්චේරි කුවිතාන්සියක් සෑම ටෙන්ඩර් පත්‍රයකටම අමුණා එවිය යුතුයි. කුවිතාන්සියේ අංකය සහ දිනය ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

3. (1) සෑම ටෙන්ඩර් පත්‍රයකටම, ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයක මුල් පිටපතද අමුනා තිබිය යුතු අතර එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල, මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුය. වත්කම් සහතිකයක් සමග එවා නැති ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ යුතුය. ටෙන්ඩරයක සඳහන් වටිනාකමින් සියයට විසිපහකට අඩු යම් වටිනාකමක් සඳහා වූ වත්කම් සහතිකයක් සමග එවූ ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ යුතුය. එසේ වුවද රජයේ දිසාපති විසින් තම අභිමතය පරිදි පැන නැගී ඇති කරුණු අනුව සුදුසු යයි කල්පනා කරත හොත් මුළු වටිනාකම ටෙන්ඩරයේ වටිනාකමින් සියයට විසිපහකට නොඅඩු ගණනකට ගෙන එනු පිණිස රේන්ද විකුණු දිනට පසු දින ප. ව. 4 ට පෙර අතිරේක වත්කම් සහතිකයක් ඉදිරිපත් කිරීමට එවැනි ටෙන්ඩර්කරුවෙකුට ඉඩදිය හැකිය. ටෙන්ඩරයේ 6(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ලබන සීමාසහිත වගකීමෙන් යුත් සමාගමකින් ඉදිරිපත් කරනු ලබන යම් ටෙන්ඩරයක්, එවැනි ටෙන්ඩරයක් සමග එවා ඇති එවැනි සමාගමක නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ වත්කම් සහතිකයෙහි වටිනාකම, එවැනි ටෙන්ඩරයකින් සියයට දහයකට නොඅඩු නම්, පිළිගත හැකිය. එක දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්ක කීපයක තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමග වත්කම් සහතිකයේ මුල් පිටපත අමුනා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩර්වලට එම සහතිකයේ සහතික පිට පත් අමුනා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතික යේ අමුනා යැවූ ටෙන්ඩරයට අදාළ තැබෑරුමේ නම, අංකය සහ එය පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය. තම ටෙන් ඩර් පත්‍රය සමග වත්කම් සහතිකයේ සහතික පිටපතක් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවෙකු විසින් ඉදිරිපත් කරනු ලැබූ තම ටෙන්ඩර් පත්‍රය පිළිගත හොත්, ඔහුට තනි බලය දීම අනිකුත් කරුණු අතර, දිසාපති විසින් මුල් සහතිකය හා සසඳා බැලීමෙන් තහවුරු කළ යුතුවූ එම වත්කම් සහතික පිටපතේ නිරවද්‍යතාවය මත රඳා පැව තිය යුතුය.

(ii) මුල් වත්කම් සහතිකය හෝ එහි සත්‍ය පිටපත ඉදිරිපත් කොට ඇති දිසාපතිගෙන් ලිඛිත අවසරයක් ලබාගතහොත් මිස හෝ ඒසේ ලැබෙනතුරු ටෙන්ඩර්කරුවකු සඳහා වත්කම් සහතිකයක් නිකුත් කිරීම පිණිස ප්‍රාදේශීය ආදායම් නිලධාරියාට පෙන්නුම් කරනු ලැබූ දේපළ අන්සතු කිරීම, විකිණීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම නොකළ යුතුය. එවැනි අවසරයක් දෙනු ලබන්නේ මුල් සහතිකය (හෝ සහතික පිටපත) ඉදිරිපත් කළ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් වරප්‍රසාද ලාභියා විසින් ලංකා රජයට ගෙවිය යුතු සියළුම ණය සහ වෙනත් ගෙවීම් සම්පූර්ණ වශයෙන් ම පියවා ඇතැයි රජයේ දිසාපති සෑහීමට පත් වුවහොත් පමණකි.

(iii) ඉහත කී කොන්දේසිය කඩ කිරීමක් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට යටත් විය යුතුය.

**5. නියෝජිතයන් ලවා ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීම හෝ එක් එක් අයකු ටෙන්ඩර්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කිරීම තහනම් බව.**—

(1) සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ඉදිරිපත් කළ යුත්තේ ඒ ටෙන් ඩර්කරුවන් ගේ ම නමිනි. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් ඉදිරි පත් කරන ටෙන්ඩර් පත්‍රයක් භාරගනු නොලැබේ.

(2) යම්කිසි එක් තැබෑරුමක් සඳහා කිසිවකු විසින් එක් ටෙන් ඩර් පත්‍රයකට වඩා වැඩි ගණනක් නොඑවිය යුතුය.

(3) යම්කිසි එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි දෙනෙකු විසින් හවුලේ ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීම නොකළ යුතුය.

**6. ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමට ඇති නුසුදුසුකම්: භාර ගැනීම නිෂ්ප්‍රභ බව හා බල රහිත බව.**—

(1) (අ) ලංකා පුරවැසියකු නොවූ; හෝ

(ආ) පිරිමියකු නොවූ; හෝ

(ඇ) ඒවකට වලංගු වාරයේ සහල් සලාක පොතක් දරන්නකු නොවූ; හෝ

(ඈ) අවුරුදු 21 ට අඩු වූ; හෝ

(ඉ) කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කාරයන්ගේ නාමාවලියෙහි හෝ කිනම් සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධයෙන් වුවද නීතිය පැහැර හැරියවුන්ගේ නාමාවලියෙහි හෝ වෙනත් හේතුන් නිසා ආණ්ඩුවේ කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් වුවද, ඒ පිළිබඳ වූ කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාමාවලියෙහි නම සඳහන් වූ; හෝ

(ඊ) සුරාබදු බලපත්‍ර දැරීම හෝ සුරාබදු බලපත්‍රලාභීන් යටතේ රක්ෂාව ලබාගැනීම තහනම් කොට ඇති අය බවට සුරාබදු කොමසාරිස් ළඟ තබාගෙන ඇති නාමාවලියෙහි නම් සඳහන් වූ; හෝ

(උ) අපරාධ වැළැක්වීමේ ආඥාපනතින් අදහස් කරන අයුරු අපරාධකරුවකු වූ; හෝ

(ඌ) සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටෙක දී වුව ද, තමන්ගේ බලපත්‍රයක් අවලංගු කරනු ලැබීමට භාජන වූ; හෝ

(එ) සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන් වරකට වඩා වරදකරු කරනු ලැබූ; හෝ

(ඒ) මේ තනි වරප්‍රසාදය ආරම්භ වන දිනයට කලින් වූ දෑවුරුද්ද ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ කිසිම තැනැත්තකුගෙන් කිසිම ටෙන්ඩර් පත්‍රයක් භාරගනු නො ලැබේ.

එසේ වුවද (ඇ) ඡේදයේ සඳහන් පරිදි සහල් සලාක පොතක් අහිමි තැනැත්තකු සම්බන්ධයෙන් වූ කල්හි, ඔහු විසින් සිය ස්ථිර ලිපිනය දැක්වෙන සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම සේවකගෙන් ලබා ගැනීමෙන් පසු එය ප්‍රදේශයේ ආදායම් නිලධාරිලවා අනු අත්සන් තබවා ඉදිරිපත් කළහොත්, එවැනි තැනැත්තකුගේ ටෙන්ඩර් පත්‍රය රජයේ දිසාපති විසින් භාරගත හැකිය.

(2) (අ) ලංකාවේ ලියාපදිංචි නොකළ; හෝ

(ආ) රු. 10,00,000 කට අඩු නිකුත් කළ මූල ධනයක් ඇති; හෝ

(ඇ) සමාගමේ සියලුම කොටස්කරුවන් ලාංකිකයන් නොවූ; හෝ

(ඈ) ලංකාවේ ලියාපදිංචි කාර්යාලයක් නොමැති

යම් සීමාසහිත සමාගමකින් ටෙන්ඩර් පත්‍ර භාරගනු නො ලැබේ.

(3) එබඳු තැනැත්තකුගේ යම් ටෙන්ඩර් පත්‍රයක් භාරගෙන තිබේ නම් කවර අවස්ථාවකදී හෝ ඒ භාර ගැනීම හුදෙක් සවකීය අභිමතය පරිදි අවලංගු කිරීම රජයේ දිසාපති විසින් කළ හැකිය. එවිට ඒ බව ඔහු විසින් ප්‍රදානලාභියාට දැන්විය යුතුය. අවලංගු කළ බවට එබඳු යම් ආඥාවක් කළ විට මුලින් කළ භාර ගැනීම නිෂ්ප්‍රභා වී බල රහිත විය යුතුය. එවැනි අවලංගු කිරීමක් නිසා ටෙන්ඩර් කරුට, ආණ්ඩුවෙන් කිසිම අලාභයක් අයකර ගැනීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය. තව ද 10 වෙනි කොන්දේසියේ කුමක් සඳහන් වුවද එකී තැනැත්තාගේ ටෙන්ඩර් තැන්පත් මුදල හෝ ඇප තැන්පත් මුදල හෝ එකී ටෙන්ඩර් තැන්පත් මුදල හා ඇප තැන්පත් මුදල යන දෙකම රජයේ දිසාපතිගේ අභිමතය පරිදි රාජසන්තක කරනු ලැබිය හැකි ය.

**7. ටෙන්ඩර්පත්‍ර භාරදීම.**—(1) සෑම ටෙන්ඩර් පත්‍රයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රයට සම්බන්ධ තැබෑරුමේ නමද, ටෙන්ඩර් පත්‍ර කැඳවීම දැන්වීමෙහි දැක්වෙන පරිදි, අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුවෙහි වූ එහි අංකය ද, පැහැදිලිව ලිවිය යුතුය.

(2) ටෙන්ඩර් පත්‍රයක් බහා ඇති මුද්‍රා තබන ලද සෑම කවරයක්ම ටෙන්ඩර්පත්‍ර බාරගැනීමට නියමිත වේලාව ඉකුත් වීමට කලින්—

(අ) ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැතහොත්

(ආ) රජයේ දිසාපති නාමට ලිපිනය ලියා ටෙන්ඩර් වැසීමට නියමිත වේලාවට කලින් කච්චේරියට ලැබෙන පරිදි රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය.

(ඇ) එක දිනකට නියම කොට ඇති වෙන්දේසි පිළිබඳ සියළුම ටෙන්ඩර් බාර ගැනීම දිසාපති විසින් උචිත ටෙන්ඩර් දැන්වීමේ සඳහන් නිශ්චිත වේලාවකදී වසනු ලැබේ. මෙසේ එම ටෙන්ඩර් බාර ගැනීම වසා අවසන් වූ විගසම, දිසාපති විසින් හෝ මෙම කාර්‍යය සඳහා ඔහු විසින් නම් කරනු ලැබූ වෙනත් නිලධාරියකු විසින් හෝ නිශ්චිත වේලාවකදී එම ටෙන්ඩර් සියල්ලම විවෘත කළ යුතුය.

8. ටෙන්ඩර් පත්‍ර පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති බලය.—

(1) ලැබී ඇති ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ස්වකීය අභිමතය පරිදි රජයේ දිසාපති විසින් පිළිගත හැකිය.

(2) ලැබී ඇති ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර්පත්‍ර සියල්ලම ස්වකීය අභිමතය පරිදි රජයේ දිසාපති විසින් ප්‍රතික්ෂේප කළ හැකි වන අතර, ටෙන්ඩර් පත්‍ර සියල්ලම එසේ ප්‍රතික්ෂේප කළ විටක ඔහු විසින් නියම කරන ලද යම්කිසි මුදලක් ගෙවීමට යම් ටෙන්ඩර්කරුවෙකු එකග කරවා ගත නොහැකි නම් ඔහු විසින් අලුතෙන් ටෙන්ඩර්පත්‍ර කැඳවිය යුතුය.

(3) නැවත විකිණීමේදී ලැබුණු යම් ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර්පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප වුවහොත් රජයේ දිසාපති විසින් අනුමත කරනු ලබන්නා වූ ද නියම කරන ලද යම්කිසි මුදලක් රේන්ද වශයෙන් ගෙවීමට එකගවන්නාවූ ද ඕනෑම පුද්ගලයකුට තැබෑරුම සඳහා තනි වරප්‍රසාදය රජයේ දිසාපති විසින් දිය හැකිය.

(4) තැබෑරුම් කිහිපයක් ම එකම මහ නගර සභා හෝ නගර සභා හෝ සුළු නගර සභා පරිපාලන සීමාවක් තුළ පිහිටි විටෙක, එවැනි එකම මහ නගර සභා හෝ නගර සභා හෝ සුළු නගර සභා සීමාවක් තුළ පිහිටි සියළු තැබෑරුම් සඳහා තමා විසින් සාධාරන යයි සළකනු ලබන මුදලක් රේන්දය වශයෙන් ලැබෙන තුරු, එවැනි එක් එක් තැබෑරුමක් වෙනුවෙන් යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීම පිළිබඳ ස්වකීය තීරණය රජයේ දිසාපති විසින් කල් දැමිය හැකිය.

(5) එකම මුදලට ටෙන්ඩර්පත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් ලැබුනවිට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය.—එකම මුදලට ටෙන්ඩර් පත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් ලැබුන විට, රජයේ දිසාපති විසින් සිය අභිමතය පරිදි—

(අ) කාසියක් උඩ විසි කිරීමෙන්, වරප්‍රසාදය කාහට දිය යුතු ද යන්න තීරණය කිරීම; හෝ

(ආ) සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කොට අළුත් ටෙන්ඩර් පත්‍ර කැඳවීම කළ හැකිය.

9. (1) (අ). ඇප තැන්පත් මුදල.—(i) වරප්‍රසාදය මිළදී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් වීමෙන් අනතුරුව, එසේ ප්‍රකාශ කරනු ලැබූ, දවසේ හෝ විකුණූ දිනයේ ප. ව. 4 ට ප්‍රථම ඕනෑම අවස්ථාවක ප්‍රධානලාභියා විසින් රජයේ දිසාපති විසින් නියම කරන මුදලක්, ඇප තැන්පත් මුදලක් වශයෙන් ඔහු වෙත ගෙවිය යුතුය. මේ ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින්, "ගෙවීම සඳහා" සි ලකුණු කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂක චෙක්" යන ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට ම ලියන ලද චෙක්පතකින් කළ යුතුය.

මිළදී ගත් තැනැත්තා රජයේ දිසාපති විසින් එසේ කරන ලෙස ඉල්ලා සිටි විටෙක දී, මෙම කොන්දේසි අත්සන් කර, ඔහු විසින් තැන්පත් කර ඇති මුදල වරප්‍රසාදය සඳහා ගෙවිය යුතු. මාස දෙකක රේන්ද කුලියට සමාන මුදලකට අඩු වූ අවස්ථාවක ඉතිරි මුදල ගෙවිය යුතුය

(ii) ප්‍රධානලාභියා විසින් ගෙවන ලද ඇප තැන්පත් මුදල රු. 10,000 කට වැඩි වූ විටෙකදී, ඔහු කැමති නම් තමා වරප්‍රසාදය මිළදී ගත් තැනැත්තා යයි ප්‍රකාශ කරනු ලැබූ දා සිට දවස් තිහක් ඇතුළතදී, ඒ ඇපය සඳහා බැංකු ඇපයක් තැබිය හැකිය. ඒ ඇපය ආණ්ඩුවේ දිසාපති බාර ගත් විට, ප්‍රධානලාභියාට 9 (1) (අ) (2) වෙනි කොන්දේසිය යටතේ තැබූ තැන්පත් මුදල ඔහුට ආපසු දිය යුතුය.

(iii) බලාපොරොත්තු රහිත හෝ නො වැළැක්විය හැකි සිද්ධීන් හේතුකොට ගෙන, වරප්‍රසාදයේ ගැනුම්කරු තමා බව ප්‍රකාශයට පත් වූ දින පස්වරු 4ට පෙර එම කොන්දේසියට අත්සන් තබා ඒ ඇප තැන්පත් මුදල ගෙවීම ප්‍රධානලාභියා විසින් කළ නොහැකි වුවහොත්, රජයේ දිසාපති විසින් තම අභිමතය පරිදි එදිනට පසු දින දවල් 12 ට පෙර ඒ කොන්දේසියට අත්සන් තබා ඒ ඇප තැන්පත් මුදල ගෙවීමට ඔහුට අවසර දිය හැකිය.

(iv) තනි වරප්‍රසාදය අවසන්වූ විට සුරාබද්ද ආඥාපනතේ 56 වැනි වගන්තිය යටතේ සිදුවූ යම්කිසි වරදක් සමථ කිරීම් වශයෙන් ලබා ගත යුතු වූ හෝ රජයට ගෙවීමට ඇති අනෙක් යම්කිසි මුදලක් හෝ ගෙවීමට අසමත් වූ විටක අයකර ගැනීම සඳහා රජයේ දිසාපති විසින් සාධාරණයයි සළකනු ලබන මුදලක් අතිරේක ඇප තැන්පත් මුදලක් ලෙස ගෙවන සේ රජයේ දිසාපති විසින් ප්‍රධානලාභියාට නියම කළ හැකිය. එසේ කිරීමට නියම කළ දින සිට දින හතක් ඇතුළත එම මුදල ප්‍රධානලාභියා විසින් රජයේ දිසාපතිට ගෙවිය යුතුය.

(ආ) බැඳුම්කරය අත්සන් කිරීම.—තමා වරප්‍රසාදය මිළ දී ගත් තැනැත්තායයි ප්‍රකාශ කරනු ලැබූ දා සිට දවස් දහතරක් ඇතුළත දී ප්‍රධානලාභියා විසින් තමා රේන්දය ගත්තේ යම් මුදලකට ද ඒ මුළු මුදල වෙනුවෙන් මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයට සාරානුකූල වූ ආකෘති පත්‍රයක ආණ්ඩුවේ දිසාපති සමග බැඳුම්කරයකට බැඳී, ඇප තැන්පත් මුදල ඒ බැඳුම්කරයෙන් ම විශේෂයෙන් යටත් කොට බැඳ තැබිය යුතුය. බැඳුම්කරය වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු නම් ඒ ගාස්තුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

(ඇ) බැඳුම්කරයේ කොන්දේසි කඩ කිරීමේ ප්‍රතිවිපාක.—මේ කොන්දේසිවලින් යමක් හෝ මෙහි පහත 13 (2) වෙනි කොන්දේසියේ සඳහන් බලපත්‍රයේ නැතහොත් බලපත්‍රවල කොන්දේසිවලින් යමක් කඩ කිරීම නිසා හෝ යම්කිසි කොටස් මුදලක් නොගෙවීම නිසා රජයේ දිසාපති විසින් නීති මාර්ගයෙන් ක්‍රියා නොකොට තමාගේ ම අභිමතය පරිදි, ඒ ඇප තැන්පත් මුදල හෝ ඉන් කොටසක් රාජසන්තක කරනු ලැබුමට යටත් විය යුතු අතර, ඒ රාජසන්තක කිරීම ඒ කඩකිරීමේ හෝ නොගෙවීමේ හෝ හේතුවෙන් මේ කොන්දේසිවලින් නියම කරන ලද අන් කිසි දඬුවමකටත් රජය විසින් විධි වූ ප්‍රකාර නීති මාර්ගයෙන් අයිතිවාසිකම් දක්වා අය කරගත හැකි වෙන යම් මුදලකටත් අතිරේක වශයෙන් විය යුතුය.

(2) ඇප තැන්පත් මුදල බැංකුවේ තැන්පත් කිරීම.—එසේ ගෙවන ලද ඇප මුදල ප්‍රධානලාභියාගේ ම ඉල්ලීම හා වගකීම පිට රජය විසින් අනුමත කරන ලද බැංකුවක තැන්පත් කරනු ලැබේ. එබඳු තැන්පත් කිරීමක් කළ විට කල් පිරෙන දිනය වන තෙක් එයින් කිසිම මුදලක් ආපසු ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

(3) නඩු නීන්දුවකට එකඟවීමේ ඇටෝර්නි බලපත්‍ර හෝ බලය.—පිළිගත් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මුදල රුපියල් 2,000 ට වැඩි නම්, ප්‍රධානලාභියා විසින් පූර්වෝක්ත ප්‍රකාර බැඳුම්කරය අත්සන් කරන විට රජයේ දිසාපති විසින් නියම කරනු ලැබුවහොත් මේ වරප්‍රසාදය සඳහා ගෙවිය යුතු යම් මුදලක් අයකර ගැනීමට ඔහුට විරුද්ධව පවරන යම් නඩුවක දී ඒ නඩු තීන්දුවට එකඟවීමේ ඇටෝර්නි බලපත්‍රයක් හෝ බලයක් නීතියෙන් අනුමත කරන ලද ආකෘතිය අනුව ලියා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 32 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය අධිකරණයෙහි අමුණා තැබීම සඳහා, එකී ඇටෝර්නි බලපත්‍රය හෝ බලය ලියූ දින සිට පසළොස් දිනක් ඇතුළතදී එය විධිමත් ලෙස සහතික කළ පිටපතක් ද රජයේ දිසාපති වෙත යැවිය යුතුය.

(4) ලියාපදිංචි කළ තැපැල් ලිපිනය.—ප්‍රධානලාභියා විසින් මේ කොන්දේසි අත්සන් කරනු ලබන විට, වරප්‍රසාද පිළිබඳ සියළුම දැන්වීම් හා කැඳවීම් නියෝග තමාට එවිය යුතු තැපැල් කාර්යාලයට හෝ තැපැල් ලිපිනය තීරණය කර, එය ලියවිල්ලකින් අත්සන් කොට දිය යුතුය. ඒ තැපැල් කාර්යාලට නොහොත් තැපැල් ලිපිනයට ලැබෙන ලෙස යථා කාලයේ දී තැපැල් කරන ලද එකී සියලු දැන්වීම් හෝ කැඳවීම් නියෝග විධි වූ ප්‍රකාර බාර දෙනු ලැබූ ලෙස සැළකිය යුතු අතර ඒ දැන්වීම් හෝ කැඳවීම් නියෝග එසේ තැපැල් කරන්නට යෙදුන දිනයේ දී එය ප්‍රධානලාභියාට පෞද්ගලිකව බාරදෙනු ලැබූ ලෙස සියලු කටයුතු සඳහා පිළිගත යුතුය.

10. වරප්‍රසාදය මිළ දී ගැනීම සම්පූර්ණ කිරීමට නොහැකිවීම.—යම් ටෙන්ඩර්කරුවකු විසින් තමා වරප්‍රසාදය මිළ දී ගත් ගැනුම්කරු යයි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු, 9 (i) වැනි කොන්දේසියෙහි සඳහන් කාලය තුළ දී විකිණීම් කොන්දේසි අත්සන් කිරීමට ප්‍රතික්ෂේප කළ හොත් හෝ ඔහු විසින් එසේ කළ නොහැකි වුවහොත්, නැතහොත් ඒ කොන්දේසියෙන් නියමිත ඇපය එකී කාල සීමාව තුළ තැබීම ඔහු විසින් කළ නොහැකි වුවහොත් ඔහු වෙත ප්‍රදානය කරන ලද වරප්‍රසාදය අවලංගු වී බලරහිත වූ බව සහ 4 වැනි කොන්දේසිය යටතේ ඔහු විසින් තබන ලද තැන්පත් මුදලට ඔහු අහිමි වූ බව ප්‍රකාශ කළ යුතු ය. තවද ඒ පැහැර හරින්නා ස්වකීය නාමය සියලු සුරාබද්ද බලපත්‍ර සම්බන්ධයෙන් වූ පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබීමට යටත් විය යුතුය. මේ ව්‍යතිරේකයට යටත් ව සාර්ථක ටෙන්ඩර්කරු විසින් විකිණීමේ කොන්දේසි අත්සන්කොට ඉහත සඳහන් ඇපය තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ

**11. නව තනි වරප්‍රසාදය මිළට ගැනීමෙන් පසුව, එහෙත් එම වරප්‍රසාදය ආරම්භවීමට පළමුව එවකට බලපවත්නා තනි වරප්‍රසාදය අවලංගු කිරීමේ ප්‍රතිවිපාක.**—තනි වරප්‍රසාදය මිළට ගත් තැනැත්තා මේ රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීමෙන් පසුව එහෙත් ඇත්ත වශයෙන් ම එම වරප්‍රසාදය ආරම්භ වීමට පළමුව එවැනි රේන්ද මිළට ගත්තකු විසින් ලබාගෙන තුබූ අරක්කු, රා හෝ විදේශීය මත්පැන් විකිණීමේ යම්කිසි තනි වරප්‍රසාදයක් අවලංගු කරනු ලැබුවහොත්, රජයේ දිසාපති විසින් ස්වකීය පරම අභිමතය පරිදි 8 (1) වැනි කොන්දේසිය යටතේ තනි වරප්‍රසාදය පිළිගැනීම අවලංගු කොට ප්‍රදානලාභියාට තම අවලංගු කිරීමේ නියෝගය ගැන දැනුම් දිය හැකිය. එවැනි අවලංගු කිරීමේ නියෝගයක් කළ විට මුලින් කළ පිළිගැනීම අවලංගු ද බල රහිත ද වන්නේ ය. එවැනි අවලංගු කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් රජයෙන් කිසිදු වන්දියක් ඉල්ලා සිටීමට තනි වරප්‍රසාදය මිළට ගත් අයට හිමිකමක් නැත. 10 වැනි කොන්දේසියේ සඳහන් කිසිවක් ගැන නොසලකා 4 වැනි කොන්දේසිය යටතේ තුබූ තැන්පත් මුදලක් හෝ 9 (1) (අ) වැනි කොන්දේසිය යටතේ තැබූ ඇප තැන්පත් මුදලක් හෝ එකී තැන්පත් මුදල් දෙවර්ගයම හෝ රාජසන්තක වීමට යටත් විය යුතුය.

**12. අරක්කු සහ රා විකිණීම් පිළිබඳ කිසිම සම්බන්ධතාවක් ප්‍රදානලාභියාට නොතිබිය යුතු බව.**—ප්‍රදානලාභියා විසින්, නියම වශයෙන් හෝ අනියම් වශයෙන්, (අ) මෙහි 1 (1) (ආ) කොන්දේසියෙහි විධිවිධාන ප්‍රකාර හැර, අරක්කු විකිණීම සම්බන්ධයෙන් හෝ, (ආ) අරක්කු විකිණීමේ යම් වරප්‍රසාදයක් මිළ දී ගැනීම සම්බන්ධයෙන් හෝ, (ඇ) මෙහි 1 (1) (ඇ) කොන්දේසියේ විධිවිධාන ප්‍රකාරයට හැර පැසුණු රා විකිණීමේ සම්බන්ධයෙන් හෝ (ඈ) රටබීම විකිණීමේ වරප්‍රසාදයට අයත් ප්‍රාදේශීය කොට්ඨාශය ඇතුළත පැසුණු රා විකිණීමේ කිසිම වරප්‍රසාදයක් මිළ දී ගැනීම සම්බන්ධයෙන් හෝ, (ඉ) රට බීම විකිණීමේ වරප්‍රසාදයට අයත් ආදායම් දිස්ත්‍රික්ක ඇතුළත, කිසිම ධාන්‍ය මත්පැන් විකුණන වතු සුරාසැලක් සම්බන්ධයෙන්, යම් කොටසක් හෝ යම් අයිතිවාසිකමක් හෝ අත්පත් කර ගැනීම හෝ දැරීම හෝ නො කළ යුතුය.

**13. (1) තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය අනුමත කිරීම හා නියම දවසේ දී තැබෑරුම විවෘත කිරීම.**—(අ) ප්‍රදානලාභියා විසින්, මේ වරප්‍රසාදය වලංගුවීමට ආරම්භ වන දවසේ දී තැබෑරුම හෝ තැබෑරුම් විවෘත කළ යුතුය.

(ආ) ප්‍රදානලාභියාට යම් තැබෑරුමක් පිහිටුවීමට ස්ථානයක් ලබා ගත නොහැකි වූ විට ඒ සඳහා ස්ථානයක් සොයා දීමට රජයේ දිසාපති බැඳී නැත.

(ඇ) රජයේ දිසාපති ගේ අනුමැතිය නැතිව, ප්‍රදානලාභියා විසින් කිසිම ස්ථානයක තැබෑරුමක් විවෘත නොකළ යුතුය. මේ වරප්‍රසාදය වලංගු වීම ආරම්භ වන දවසට අඩු වශයෙන් දවස් දහහතරකට කලින් රජයේ දිසාපතිගෙන් එකී අනුමැතිය ලබා ගත යුතුය.

**(2) විදේශීය මත් පැන්, අරක්කු සහ බෝතල්වල පිරවූ රා විකිණීම සඳහා බලපත්‍ර ලබාගැනීම.**—ප්‍රදානලාභියා විසින්, මේ වරප්‍රසාදය වලංගුවීම ආරම්භ වන දවසට පස් දවසකට නොඅඩු දින ගණනකට කලින් මේ වරප්‍රසාදයට අසුවන ප්‍රාදේශීය කොට්ඨාශය ඇතුළත පිහිටි තැබෑරුම හෝ තැබෑරුම්වල විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම සඳහා බලපත්‍රයක් හෝ බලපත්‍ර රජයේ දිසාපතිගෙන් ලබාගත යුතුය. අරක්කු විකිණීමටද අවසර ලත් ප්‍රදේශය ඇතුළත පිහිටි තමාගේ යම්කිසි තැබෑරුමක හෝ තැබෑරුම් සියල්ලෙහිම හෝ අරක්කු විකිණීමට ද කැමැත්තේ නම්, ප්‍රදානලාභියා විසින් ඒ තැබෑරුම හෝ තැබෑරුම් සම්බන්ධයෙන් මෙහි (1) (ආ) වැනි කොන්දේසියේ සලසා ඇති විධිවිධාන අනුව ඒ සඳහා බලපත්‍රයක් ද ලබාගත යුතුය. එසේ ම, බෝතලවල පිර වූ රා විකිණීමට අවසර ලත් ප්‍රදේශය ඇතුළත පිහිටි තමාගේ, යම් කිසි තැබෑරුමක හෝ තැබෑරුම් සියල්ලෙහි ම හෝ බෝතල් රා විකිණීමට ද කැමැත්තේ නම්, ප්‍රදානලාභියා විසින්, ඒ තැබෑරුම හෝ තැබෑරුම් හෝ සම්බන්ධයෙන් මෙහි (1) (ඇ) වැනි කොන්දේසියේ සලසා ඇති විධි විධාන අනුව, ඒ සඳහා ද බලපත්‍රයක් ලබාගත යුතු ය.

14. (1) **රේන්ද මුදල් ගෙවීම.**—ප්‍රදානලාභියා විසින්, ගැනුම් මුදල හෝ රේන්ද මුදල සමාන මාසික කොටස් දොළහකින් රජයේ දිසාපතිට ගෙවිය යුතුය.

එසේ වුවද, දිසාපති විසින්, තම අභිමතය පරිදි, 9 (1) දරණ කොන්දේසිය යටතේ තැන්පත් කර ඇති ඇප මුදලෙන් රජයට අයවිය යුතු යම් මුදලක් තබා ගැනීමෙන් පසු, ගැනුම් මිලෙයි එකොලොස් වැනි සහ දොළොස් වැනි මාසික කොටස් මුදලින් කොටසක් එසේ තබා ඇති තැන්පත් මුදලින් හිලවුකර ගැනීමට ඉඩ දිය හැකිය.

(2) **කොටස් මුදල් ගෙවිය යුතු දිනය.**—රේන්ද මුදලේ පළමුවැනි කොටස් මුදල වූ කලී එම වරප්‍රසාදය ආරම්භ වීමට පෙරාතුව වූ මාසයේ අවසාන දිනයේ දී ගෙවිය යුතු ලෙස සැලකිය යුතුය. තවද වරප්‍රසාදය ආරම්භ වීමට පෙරාතුව වූ මාසයේ අවසාන දිනයෙහිදී හෝ ඊට පෙර 9 (1) (අ) වැනි කොන්දේසියෙහි නියමිත ආකාරයට, එම කොටස් මුදල සම්පූර්ණයෙන් ගෙවිය යුතුය.

ඊට පසුව ගෙවිය යුතු කොටස් මුදල් එක් එක් පසුව පැමිණෙන මාසයෙහි අවසාන දිනයෙහි දී වෙන් වෙන් ව ගෙවිය යුතු ලෙස සැලකිය යුතුය.

එසේ වුවද—

(1) යම් මාසයක අවසාන දිනය පෝය දිනයක් වුවහොත්, ඊළඟ දිනයෙහිදී ද නැතහොත් ඒ දිනය ආණ්ඩුවේ නිවාඩු දිනයක් වුවහොත් ඊළඟ දිනයෙහිද කොටස් මුදල ගෙවිය යුතුය. එසේ නැතහොත්

(2) යම් මාසයක අවසාන දිනය ආණ්ඩුවේ නිවාඩු දිනයක් වුවහොත්, ඊළඟ දිනයෙහි දීද නැතහොත් ඒ දිනය ආණ්ඩුවේ නිවාඩු දිනයක් හෝ පෝය දිනයක් වුවහොත් ඊළඟ දිනයෙහි දීද කොටස් මුදල් ගෙවිය යුතුය.

හැම රේන්ද කොටස් මුදලක් ම පෝය දිනට පෙර දින හැර සතියේ සෙසු දවස්වල ප. ව. 3 ට කලින් ද පෝය දිනයට පෙර දිනයෙහි නම් දවල් 12 ට කලින් ද කච්චේරියේ සරප් කවුන්ටරයේ දී ඉදිරිපත් කළ යුතුය.

(3) **පොලී හා දණ්ඩන.**—හිඟ හිටවන සියලු මුදල් හෝ රේන්ද මුදල් වෙනුවෙන් අවුරුද්දකට සියයට 12 බැගින් පොළිය ගෙවිය යුතුය.

ප්‍රදානලාභියාට දී තිබෙන බලපත්‍රය 27 වෙනි වගන්තිය යටතේ අවලංගු කිරීමට පුළුවන් වන යම් අවස්ථාවකදී ආඥාපනතේ 56 වෙනි වගන්තිය යටතේ රජයේ දිසාපතිට ක්‍රියාවේ යෙදවිය හැකි බලතලවලට මෙසේ පොළී ගෙවීම නිසා කිසිම හානියක් හෝ අවාසියක් සිදු වෙතැයි නොසැලකිය යුතුය.

15. (1) **කච්චේරි කුවිතාන්සියක් නොමැති ගෙවීම් බල රහිත බව.**—ප්‍රදානලාභියා විසින් ගෙවන ලද මුදල වෙනුවෙන් කච්චේරි කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් මිස, රේන්දය ලැබූ ප්‍රදානලාභියාගෙන් රජයට අයවිය යුතුව තිබෙන යම්කිසි මුදලක් විධිමත් ලෙස ගෙවන ලදැයි නොසැලකිය යුතු ය.

(2) **නිලධාරීන් වෙත තබන මුදල් ගෙවූ මුදල් වශයෙන් නොසලකන බව.**—ප්‍රදානලාභියාගේ කැමැත්ත පරිදි තමාගේ ම පහසුව පිණිස, කච්චේරියේ යම් සරප් කෙනෙකු ළඟ හෝ වෙන යම් නිලධරයකු ළඟ තබන්නට යෙදෙන කිසිම මුදලක් මේ කොන්ත්‍රාත්තුව යටතෙහි ගෙවන ලද මුදලක් වශයෙන් නොසැළකිය යුතුය.

16. (1) **අරක්කු විකිණීමට ඉඩ දෙන ලද්දේ නම් අරක්කු මිළ දී ගන්නා ක්‍රමය.**—සුරාබදු කොමසාරිස් විසින් පූර්වෝක්ත 1 (1) (ආ) කොන්දේසිය යටතේ පිප්ප අරක්කු පමණක් සිල්ලරට විකිණීමට බලපත්‍රයක් දෙන ලද්දේ නම් රේන්දය ලැබූ තැනැත්තා විසින් ඒ සියලුම අරක්කු—

(අ) පිප්ප ගණනේ පමණක් ;

(ආ) ඔහුගේ විදේශීය මත්පැන් තැබෑරුම පැවුරුණු අරක්කු තැබෑරුමෙන් හෝ තැබෑරුම් සමූහයකට අයත් යම් තැබෑරුමකින් පමණක් ;

(ඇ) මහජනයාට අරක්කු විකිණීමට එකී තැබෑරුමේ රේන්දකාරයාට නීතියෙන් බලය දෙන ලද මිළට ;

(ඈ) සුරාබදු අධිකාරී විසින් නිකුත් කරන ලද වලංගු ප්‍රවාහණ අවසර පත්‍රයක් පිට පමණක් ; සහ

(ඉ) සුරාබදු අධිකාරී විසින් නිකුත් කරන ලද වලංගු ප්‍රවාහණ පත්‍රයෙහි පළ වූ 439 වෙනි සුරාබදු නිවේදනයේ ඒ. (ඇෆ්. ඇල්.) 1 වෙනි ආකෘති පත්‍රයෙහි 16 වෙනි කොන්දේසියේ විධිවිධානවලට යටත් ව

මිළදී ගත යුතුය.

(2) **අරක්කු තැබෑරුම් රේන්දකාරයා කෙරෙහි ඇති පරිපාලනාත්මක අයිතිවාසිකම්.**—අරක්කු තැබෑරුමක රේන්දකාරයෙකු විසින්, මේ ප්‍රදානලාභියා එසේ අරක්කු සපයනු ලබන කල්හි, අරක්කු විකිණීම සම්බන්ධයෙන් තමාට ඇති වරප්‍රසාදය ආරක්ෂා කර ගැනීම පිණිස සුරාබදු ඒ. (ඇෆ්. ඇල්.) 1 වෙනි ආකෘති පත්‍රයේ ප්‍රකාරයට වූ බලපත්‍රයේ කොන්දේසිවලින් සැලසී ඇති පරිපාලනාත්මක අයිතිවාසිකම්, එකී අරක්කු තැබෑරුම් රේන්දකාරයා කෙරෙහි තිබේ.

17. **විදේශීය මත්පැන් සහ අරක්කු සියල්ල ගැන ප්‍රදානලාභියා විසින් ගණන දිය යුතු බව : ඉහිරුම් පාළුව.**—තමා විසින් කලින් කල මිළ දී ගත් විදේශීය මත්පැන් සහ අරක්කු සියල්ල ගැන ප්‍රදානලාභියා විසින් ගණන් දිය යුතුය. සියලුම වර්ගවලට අයත් විදේශීය මත් ද්‍රව්‍ය සහ පිප්පවල ගබඩා කළ අරක්කු වෙනුවෙන් හටිනු ලබන ඉහිරුම් පාළුව, තොග ගණන් ගැනීම සඳහා විධිමත් ව අවසරය දෙනු ලැබ සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු විසින් අන්තිම වරට තොග ගණන් ගත් දිනයෙන් පසුව මිළදී ගත් සම්පූර්ණ ප්‍රමාණයෙන් සියයට දෙකකට වඩා කිසිම කරුණක් නිසා වැඩි නොවිය යුතුය.

18. **කම්කරුවන් රක්ෂාවෙහි යෙදීම හා සේවකයන්ට ගෙවිය යුතු වේතන.**—මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට ප්‍රදානලාභියා විසින් පෙළපතින් හෝ ලියා පදිංචි වීමෙන් ලංකා පුරවැසියන් වූ කම්කරුවන් පමණක් යෙදවිය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට වැඩය කෙරෙන ප්‍රදේශයෙන් බඳවා ගත යුතුය.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට ප්‍රදානලාභියා යම් කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබුමට යටත් විය යුතුය. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලංකා පුරවැසියන් නොවන කම්කරුවන් යෙදවීමට ප්‍රදානලාභියා විසින් අවසර දිය හැකිය.

එවැනි ලිඛිත අවසරයක් හා එකඟත්වයක් නොමැතිව එබඳු කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සැලකිය යුතුය.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරුවකුටම කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන නියෝග අනුව වේතන ප්‍රදානලාභියා විසින් ගෙවිය යුතුය.

ප්‍රදානලාභියා විසින් එකී වැඩවල යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පොත්, චැක්රෝල් පොත්, පෙරෙවුටු පොත් සහ අනිකුත් ලේඛන පරීක්ෂා කර බැලීමට විධිමත්ව බලය දෙනු ලැබූ සුරාබදු දෙපාර්තමේන්තුවේ හෝ කම්කරු දෙපාර්තමේන්තුවේ හෝ ආදායම් බදු දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකුට ඒවා බැලීමට හා පරීක්ෂා කිරීමට ඉඩ දිය යුතුය.

19. **නියෝජිතයින්ගේ ක්‍රියා ගැන ප්‍රදානලාභියා වගකිව යුතු බව.**—වරප්‍රසාදය සම්බන්ධයෙන් තම නියෝජිතයන් හා සේවකයන් විසින් කරනු ලබන සියලුම කටයුතු ගැන ප්‍රදානලාභියා වගකිව යුතුය.

20. (අ) **වරප්‍රසාදය අන් අයකුට පැවරිය නොහැකි බව.**—සුරාබදු කොමසාරිස් ගේ අනුමැතිය කලින් ලබාගෙන තිබෙතොත් මිස, මේ වරප්‍රසාදය වෙන කෙනෙකුට පැවරිය නොහැකි විය යුතුය.

(ආ) ප්‍රදානලාභියකු විදේශීය මත්පැන් තැබෑරුම පවත්වාගෙන යෑම සඳහා ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුගේ මුදලින් හෝ වෙනයම් කිසි ක්‍රමයකින් නියම ලෙස හෝ අනියම් ලෙස ආධාර ලබන බව යම්කිසි අවස්ථාවක ඔප්පු වුවහොත්, ඒ ප්‍රදානලාභියාට දෙනු ලැබූ වරප්‍රසාදය අවලංගු හා බල රහිත බව එකෙනෙහි ම ප්‍රකාශ කළ යුතුය.

21. (1) (අ) **රේන්ද මුදල් නොගෙවීම නිසා බලපත්‍ර සහ වරප්‍රසාද අවලංගු කිරීම.**—තමන් වෙත නිකුත් කරන ලද ප්‍රදානය හෝ බලපත්‍රය වෙනුවෙන් වූ ගැනුම් මුදලේ හෝ රේන්දයේ යම් කොටස් මුදලක් හෝ යම් කොටස් මුදලක පංගුවක් හෝ, ප්‍රදානලාභියාගෙන් රජයට අයවිය යුතු යම් තීරුවක්, ගාස්තුවක් හෝ වෙනත් යම් මුදලක් එසේ අය විය යුතු සහ ගෙවිය යුතු දිනය පසුවන තෙක් නොගෙවා ඇතොත්, ප්‍රදානලාභියා මේ කොන්දේසි හා තමාට දෙන ලද බල පත්‍රයේ කොන්දේසි කඩ කළ ලෙස සැලකිය යුතුය. තවද ඒ අනුව වෙනත් යම් නීති මාර්ගයක් අනුගමනය නොකොට (2) ප්‍රදානලාභියාට දෙන බලපත්‍රය හෝ බලපත්‍ර, සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, අත්හිටවීමට හෝ අවලංගු කිරීමට නැතහොත් (ii) එකී ආඥාපනතේ 31 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර එසේ කිරීමට තමා අදහස් කරන බව බලපත්‍රලාභියා හෝ ප්‍රදානලාභියා වෙත දින 15 ක ලිඛිත දැනුම්දීමකින් පසු, ප්‍රදානලාභියාගේ ම වගබලාගැනීම පිට බලපත්‍රය හෝ වරප්‍රසාදය තමා යටතට ගැනීමට හෝ බලපත්‍රය හෝ වරප්‍රසාදය අහිමි කළ බව ප්‍රකාශ කොට ප්‍රදානලාභියාගේ ම වගබලාගැනීම හා අලාභය පිට, එය නැවත නිකුත් කිරීමට හෝ නැවත විකිණීමට රජයේ දිසාපතිට බලය ඇති විය යුතුය. රජයේ දිසාපති විසින් ඉහත සඳහන් ප්‍රකාර යම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබෙන කල්හි එසේ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රජයට දැරීමට සිදුවන යම් පාඩුවක් ප්‍රදානලාභියාට ලැබිය යුතුව තිබෙන මුදල් වලින් හෝ මේ වරප්‍රසාදය හෝ වෙන යම් වරප්‍රසාදයක් සම්බන්ධයෙන් නැත හොත් ප්‍රදානලාභියා හෝ ප්‍රදානලාභීන් සහ රජය අතර පවත්නා කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අවශ්‍යාවෝචිත පරිදි ඔවුන් එක් කෙනෙකුට හෝ වැඩි දෙනකුට ලැබිය යුතුව ඇති මුදල් වලින් හෝ අන් කවර ආකාරයකින් වුවද, වූ ගිණුමක් පිට එකී ප්‍රදානලාභියාට හෝ ප්‍රදානලාභීන්ට රජයෙන් ලැබිය යුතුව ඇති වෙනත් යම් මුදලකින් අය කර ගත හැකිය.

ඉහත සඳහන් 9 වැනි කොන්දේසියේ විධිවිධාන ප්‍රකාර ඇප තැන්පත් මුදල රාජසන්තක කිරීම සඳහා රජයේ දිසාපතිට ඇති බලතල වලට මේ කොන්දේසිය කිසි ලෙසකිනුදු හානි නොවෙයි.

(ආ) **අවලංගු කිරීම ආදිය පිළිබඳ නිවේදන හෝ දැන්වීම.**—එකී 27 වැනි වගන්තිය යටතේ කරන ලද අත්හිටවීමේ හෝ අවලංගු කිරීමේ ආඥාවක් පිළිබඳ නිවේදනය හෝ එකී 31 වැනි වගන්තිය යටතේ කරන ලද ව්‍යවස්ථික දැන්වීම හෝ ආඥාව, ප්‍රදානලාභියා හට පුද්ගලිකව භාරදීම හෝ 9 (4) වැනි කොන්දේසිය යටතේ ඔහු විසින් තෝරාගෙන සඳහන් කර ඇති තැපැල් කාර්යාලයට හෝ තැපැල් ලිපිනයට විධිමත් ලෙස තැපැල් කිරීම, රජයේ දිසාපති විසින් මැනවැයි සිතන පරිදි කළ හැකිය.

(ඇ) විදේශීය මත්පැන් බලපත්‍රය එසේ අවලංගු කරනු ලැබූ විට ඉහත සඳහන් ආකාරයට එබඳු දැන්වීමක් කොට, අරක්කු බලපත්‍රයද අවලංගු කිරීමට සුරාබදු කොමසාරිස්ට බලය තිබිය යුතුය.

(2) **වරප්‍රසාදය අවලංගු කිරීම හා නැවත විකිණීම අතර කාලය තුළ ඒ වරප්‍රසාදය නැවත ප්‍රදානය කිරීම.**—විදේශීය මත්පැන් විකිණීමේ බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ විටක, ඒ විදේශීය මත්පැන් විකිණීමේ වරප්‍රසාදය අවලංගු කිරීම සහ නැවත විකිණීම අතර වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා ඒ විදේශීය මත්පැන් විකිණීමේ වරප්‍රසාදය තමන් විසින් අනුමත කරනු ලබන යම් තැනැත්තකු වෙත පැවරීමට රජයේ දිසාපති හට බලය තිබිය යුතුය. මේ සඳහා තමන් විසින් සුදුසු යයි සිතනු ලබන යම් කොන්දේසි පිට එකී අනුමත කළ අය වෙත තාවකාලිකව බලපත්‍රයක් ඔහු විසින් නිකුත් කළ හැකිය.

අවලංගු කරනු ලැබූ විදේශීය මත්පැන් තැබෑරුම් බලපත්‍රය දරු තැනැත්තා වෙත 1 (1) (ආ) කොන්දේසියේ සඳහන් අරක්කු තැබෑරුම් බලපත්‍රයක් හෝ 1 (1) (ඇ) කොන්දේසියේ සඳහන් බෝතල්වල පිරවූ රා තැබෑරුම් බලපත්‍රයක් නිකුත් කර තිබුණි නම් රජයේ දිසාපති විසින් අනුමත කරනු ලැබූ තැනැත්තා වෙත එවැනි බලපත්‍රයක් ද නිකුත් කිරීමට සුදුසු යයි තමා සිතතොත් සුරාබදු කොමසාරිස් විසින් ඔහුට එබඳු බලපත්‍රයක් නිකුත් කළ හැකිය.

(3) **රේන්ද මුදලෙන් කිසිවක් අඩු නොකරන බව.**—ප්‍රදානලාභියා විසින් යම් තැබෑරුමක වටිනාකම වැඩියෙන් තක්සේරු කරන ලදැයි කරුණු දැක්වීම නිසා හෝ වෙනත් යම් කරුණක් නිසා වරප්‍රසාදය වෙනුවෙන් ගෙවිය යුතු වූ රේන්ද මුදලකින් කිසිවක් අඩු නොකරනු ලැබේ.

(4) **පාඩු සඳහා වන්දි නොගෙවන බව.**—

(අ) යුද සෙබළුන් සංචාරයෙහි යෙදී සිටින කාලය තුළ දී හෝ තම තැබෑරුම හෝ තැබෑරුම් අසළ යුද සෙබළුන් කඳවුරු බැඳ ගෙන සිටින කාලය තුල දී හෝ යම්කිසි ඡන්ද විමසීමක් පවත්වාගෙන යන කාලය තුළ දී හෝ රෝගග්‍රස්ත ප්‍රදේශය කැයි යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ ප්‍රකාශ කරනු ලැබූ කොට්ඨාශයක් තුළ හෝ ඊට ආසන්නව තැබෑරුම හෝ තැබෑරුම් පිහිටා තිබීම නිසා තම තැබෑරුම හෝ තැබෑරුම් වසා තිබීමට සිදුවීම හේතු කොටගෙන ; හෝ

(ආ) මේ කොන්දේසි යටතේ වරප්‍රසාදය විකිණීමෙන් පසු දෙන ලද බලපත්‍රයක් පිට අලුතෙන් යම්කිසි අරක්කු තැබෑරුමක් හෝ රා තැබෑරුමක් හෝ අරක්කු හෝ රා හෝ රට බීම විකිණීම පිණිස වතු සුරා සැලක් හෝ රට බීම තැබෑරුම් බල පත්‍රයක් යටතේ හැර, වෙන යම් කවර වර්ගයක හෝ පංතියක රට බීම බලපත්‍රයක් යටතේ මෙරට බීම, රට බීම හෝ විකිණීම සඳහා බලපත්‍ර ලත් ස්ථානයක් හෝ විවෘත කිරීම හේතු කොට ගෙන ; හෝ

(ඇ) සහකාර සුරාබදු කොමසාරිස් විසින් නිකුත් කරන ලද විශේෂ බලපත්‍ර පිට විකිණීමට නොව, හුදෙක් අවංක අදහසින් වෛද්‍යෝපදේශ අනුව, ගෘහ පරිභෝගය සඳහා පැසුණු රා සෑදීම හා බෑම හේතු කොට ගෙන ; හෝ

(ඈ) රා සෑදීමේ කර්මාන්තය කරගෙන යෑමේදී රා පාවිච්චි කරන බලපත්‍ර ලත් කර්මාන්තශාලාවට සැපයීම සඳහා මෙසින් වරප්‍රසාදය දෙනු ලබන ප්‍රාදේශීය කොට්ඨාශය නොහොත් කොට්ඨාශ ඇතුළත පැසුණු රා සෑදීම හා බෑම හේතු කොට ගෙන ; හෝ

(ඉ) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නැතිව, සීමාරහිතව මීරා මැදීම හා බෑම හේතුකොට ගෙන ; හෝ

(ඊ) යට කී 1 (1) (ආ) කොන්දේසි හෝ නියමයන් අනුව විශේෂ අරක්කු බලපත්‍ර දීම සුරාබදු කොමසාරිස් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතු කොට ගෙන ; හෝ

(උ) 1931 අප්‍රේල් මස 17 වෙනි දින හා 7,845 වෙනි අංකය දරන ගැසට් පත්‍රයේ පළ වූ 218 වැනි අංකය දරන සුරාබදු නිවේදනයේ 14 වෙනි හා 16 වෙනි ඡේදයන් හි විස්තර කරන ලද පරිදි රට බීම විකිණීම සඳහා අවස්ථා බලපත්‍ර හෝ විශේෂ බලපත්‍ර නිකුත් කිරීම හේතු කොට ගෙන ; හෝ

(ඌ) වරප්‍රසාදය දී ඇති ප්‍රාදේශීය කොට්ඨාශය හෝ කොට්ඨාශ ඇතුළත වෙන මත්පැන් වර්ග සෑදීමට හා/හෝ විකිණීමට බලපත්‍ර නිකුත් කිරීම හේතුකොට ගෙන ; හෝ

(එ) වෙන යම් කිසි හේතුවක් නිසා ; හෝ

තමන්ට විඳින්නට සිදු වූයේ යැයි කියන ලද යම් පාඩුවක් නිසා තමන්ගෙන් ආණ්ඩුවට අයවිය යුතු වූ සහ තමන් විසින් ආණ්ඩුවට ගෙවිය යුතු වූ කිසිම මුදලකින් කිසිවක් අඩුකර ගැනීමට හෝ ආපසු ගැනීම හෝ එසේ කිරීමට හිමිකම් කීමට අයිතිවාසිකමක් ප්‍රදානලාභියා හට නොතිබිය යුතු ය.

**22. වරප්‍රසාදය අවසන් වීම.—**

(අ) වරප්‍රසාදයට අයත් කාලපරිච්ඡෙදය ඉකුත් වූ විට ; හෝ

(ආ) ප්‍රදානලාභියා මැරුණු විට ; හෝ

(ඇ) වරප්‍රසාදය පාලනය වන කොන්දේසි වලින් කිසිවක් කඩ කළ විට ;

හෝ වරප්‍රසාදය අවසාන විය යුතුය.

එසේ වුවද, ප්‍රදානලාභියා මැරුණු අවස්ථාවක, වරප්‍රසාදයට අයත් කාලපරිච්ඡදය අවසන් වන තෙක් ඒ වරප්‍රසාදය භුක්ති විඳගෙන යෑමට, ඒ ප්‍රදානලාභියා ගේ බූදලයේ බලකරුට හෝ පරිපාලකට නතැහොත් ඒ ප්‍රදානලාභියා ගේ නිත්‍යානුකූල උරුමක්කාරයන්ට, රජයේ දිසාපති විසින්, ස්වකීය අභිමතය පරිදි ඉඩ දිය හැකිය.

**23. බලපත්‍රය ආපසු භාර නොදිය යුතු බව.—**ආණ්ඩුව සහ ප්‍රදාන ලාභියා අතර වූ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමට සුරාබදු ආඥාපනතේ 19 (2) වැනි වගන්තියේ ප්‍රකාර නොමිළයේ දෙනු ලබන ඉහත සඳහන් 13 (2) වැනි කොන්දේසියේ සඳහන් බලපත්‍රය හෝ බලපත්‍ර රජයේ දිසාපතිගෙන් කලින් ලබාගත් ලිඛිත අවසරය ඇතිව මිස, එකී ආඥාපනතේ 28 වැනි වගන්තිය යටතේ ප්‍රදානලාභියා විසින් ආපසු භාර නොදිය යුතුය.

සුරාබදු එෆ්. එල්. 26.

## ලංකාණ්ඩුව

**විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද පිළිබඳ ටෙන්ඩර් ආකෘති පත්‍රය**

(3 වැනි කොන්දේසිය)

..............* දිස්ත්‍රික්කයේ පිහිටි ........................† ප්‍රාදේශීය කොට්ඨාශය ඇතුළත තැබෑරුම් බලපත්‍රයක් යටතේ විදේශීය මත්පැන් සිල්ලරට විකිණීමේ තනි වරප්‍රසාදය මිලට ගැනීම සඳහා වූ ටෙන්ඩර් පත්‍රයයි.

........................ රජයේ ඒජන්ත වෙතටයි.

......................දින දරන ඔබගේ දැන්වීම අනුව ඔක්තෝබර් මස 1 වැනි දින පටන් සැප්තැම්බර් මස 30 වැනි දින වන තෙක් එක් අවුරුද්දක කාල පරිච්ඡේදය තුළ ඉහත සඳහන් ප්‍රාදේශීය කොට්ඨාශය ඇතුළත තැබෑරුම් බලපත්‍රයක් යටතේ විදේශීය මත්පැන් සිල්ලරට විකිණීමේ තනි වරප්‍රසාදය රුපියල් ........................(අකුරෙන්) (රු...............ශ...............) ක මුදලකට මිළ දී ගැනීමට මෙහි පහත අත්සන් කරන මම/අපි මෙයින් ඉල්ලුම් කරමි/කරමු. වචන සහ ඉලක්කම් අතර යම් වෙනසක් ඇති වූ විටකදී, ඉහළ ගණන නිවැරදි ගණන සේ තීරණය කරනු ලැබේ.

.................... කච්චේරියේ රුපියල් ............................ ක මුදලක් තැන්පත් කළෙමි/කළෙමු. ඒ වෙනුවෙන්................වැනි අංකය හා ........................ වැනි දිනය දරණ කුවිතාන්සිය මීට අමුණා ඇත.

මගේ/අපගේ රුපියල් .................... ක වත්කම දැක්වෙන සහතිකය ........................... දිනෙන් අවසන් වන අංක*......... දරණ ........................ විදේශීය මත්පැන් තැබෑරුමේ රේන්දය පිළිබඳව ...................... දිසාපති වෙත රඳවා ගෙන ඇත.

විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි මාලාවේ 6 (1) වැනි විශේෂ කොන්දේසියේ සඳහන් කිසිම විධිවිධානයක් යටතේ මා/අප නුසුදුස්සකු/නුසුදුස්සන් වී නැති බැව් මම/අපි මෙයින් ප්‍රකාශ කරමි/කරමු.

අත්සන : ........................................

නම : ........................................

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය : ........................................

........................................

........................................

සාක්ෂිකරුවෝ :

(1) ..............................

(2) ..............................

* දිස්ත්‍රික්කයේ නම ලියන්න.

† තැබෑරුමේ නම ලියන්න.

**සංලක්ෂ්‍යය.—**1 රුපියල් ............ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් මේ ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය. මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් නො අමුණා එවන කිසිම ටෙන්ඩර් පත්‍රයක් බාරගනු නො ලැබේ. තැන්පත් කළ රුපියල් .................... වූ කලී විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම පිළිබඳ වූ 6 වැනි සහ 10 වැනි කොන්දේසිවල විධි විධානවලට යටත්ව ආපසු ගෙවනු ලැබේ.

2. මේ ආකෘති පත්‍රය ලියුම් කොපුවක බහා සීල් තබා ටෙන්ඩරයට අදාළ රට බීම තැබෑරුමේ නම හා අංකය ලියුම් කොපුවේ වම් පැත්තේ මුදුන් කෙළවරේ ලියා ටෙන්ඩර් වැසීමට නියමිත වේලාව ඉකුත් වී යන්නට කලින් කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැතහොත් ආණ්ඩුවේ ඒජන්තට හෝ කාර්යාල සහකාරයාට බාර දිය යුතුය. නැතහොත් කච්චේරියට ලැබෙන ලෙස ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය.

3. එක් එක් තැබෑරුම වෙනුවෙන් එක් එක් ආකෘති පත්‍රය බැගින් පාවිච්චි කළ යුතුය.

**ගිවිසුම් පත්‍රය**

(9 (1) (අ) වැනි කොන්දේසිය)

යට කී කොන්දේසි පිට, රුපියල් .................................. ......................... ක මුදලට ඉහත සඳහන් තනි වරප්‍රසාදය ........................ පදිංචි ............................................ ........................................ වන මට/අපට ප්‍රදානය කරන ලද බවත් එකී කොන්දේසි පිළිපැදීමට මම/අපි බැඳෙන බවත් දන්වමි/දන්වමු.

ප්‍රදානලාභියා/ලාභීහු.

සාක්ෂිකරුවෝ :

(1) ..............................

(2) ..............................

මේ කොන්දේසි මාලාවේ 9 (1) (අ) වැනි කොන්දේසිය යටතේ ඇප තැන්පත් මුදල වශයෙන් .................................. විසින් හා ............................................විසින් ගෙවන ලද මුදල වන රුපියල් ..........................................බාරගත් බව මෙයින් දන්වමි.

________________,

රජයේ දිසාපති.

**බැඳුම්කර ආකෘති පත්‍රය**

(9 (1) (ආ) වැනි කොන්දේසි)

සියලු දෙනා විසින් මෙයින් දැනගත යුතුයි.

.................................................................. පදිංචි .................................................................. වන මම*/අපි, ප්‍රතාපවත් දෙවෙනි එලිසබෙත් රාජනීන් වහන්සේට ද, උන් වහන්සේගේ උරුමක්කාරයන්ට හා අනුප්‍රාප්තිකයන්ට ද ලංකාවේ වලංගු මුදලින්, රුපියල් .................................. නිසි ලෙස හා සත්‍ය ලෙස ගෙවීමට මම*/අපිද, මගේ*/අපගේ උරුමක්කාර, බලකාර, පරිපාලක හා පෞද්ගලික නියෝජිතයින් සියලු දෙනා ද, ඔවුන් එක් එක්කෙනා ද මෙයින් බැඳ තබමි/මු. තව ද මේ බැඳුම් කරය යටතේ අයවිය යුතු හා ගෙවිය යුතු සියලු මුදල් එකී රාජනීන් වහන්සේට හා උන්වහන්සේගේ උරුමක්කාරයින්ට හා අනුප්‍රාප්තිකයන්ටද නිසි පරිදි ගෙවීම ආරක්ෂා කිරීම පිණිස එකී ............................... වන මා*/අප විසින් ........................... වෙත 19............... මස .............. වැනි දා තැන්පත් කරන ලද රුපියල් ............................... වන මුළු මුදල ම එකී රාජිනීන් වහන්සේට සහ උන්වහන්සේගේ උරුමක්කාරයන්ට හා අනුප්‍රාප්තියන්හට ද විශේෂ වශයෙන් උගස් කොට, හිමි කොට මෙයින් පවරා දෙමි*/දෙමු.

19.............. මස .............. වැනි දින වන මෙදින එකී ......... .................................. විසින් .................................. ..............................................දී අත්සන් කරන ලදී.

.......................................... සඳහා මෙහි ඉහත සඳහන් ලෙස බැඳී සිටින .......................................... එකී රාජිනීන් වහන්සේ හා උන්වහන්සේගේ උරුමක්කාරයන් හා අනුප්‍රාප්තික යන් වෙනුවෙන් ක්‍රියා කරන .......................................... සමග 19...... මස ...........වැනි දින දරන " ඒ " අක්ෂරය යොදා මීට යා කොට ඇත්තාවූද කොන්ත්‍රාත්තුවට බැඳී ඇති හෙයින්.

*නුවුවමනා වචන කපා දමන්න.

දැන් මේ ලියා අත්සන් කර දෙන බැඳුම්කරයේ කොන්දේසි නම්, එකී කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් එකී...........විසින් කළ යුතු වූ, පිළිපැදිය යුතු වූ සහ සම්පූර්ණ කළ යුතු වූ ද, එකී කොන්දේසි වල එක් එක් වගන්තිය සහ සියළුම වගන්ති, මනා ලෙස හා අවංක ලෙස ඉටු කොට, පිළිපැද සම්පූර්ණ කළහොත් එවිට මේ බැඳුම්කරය අවලංගුව නිෂ්ප්‍රභා විය යුතු අතර, එසේ නො කළ හොත් මේ බැඳුම්කරය සම්පූර්ණ බල සහිතව වලංගු විය යුතුය.

සාක්ෂිකරුවෝ :

**දැන්වීම සහ ලිපිනය**

(9 (4) වැනි කොන්දේසිය)

ඉහත සඳහන් වරප්‍රසාදය පිළිබඳ වූ සියලුම දැන්වීම් හා කැඳවීම් නියෝග මා/අප නමට ලියා තැපැල් කළ යුතු තැපැල් කාර්යාලය/ තැපැල් ලිපිනය වූ කලී පහත සඳහන් තැපැල් කාර්යාලය/තැපැල් ලිපිනය බැව් මෙහි පහත අත්සන් කරන මම/අපි 9 (4) කොන්දේසියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරමි./කරමු.

__________,

ප්‍රදානලාභියා/ලාභීහු.

සාක්ෂිකරුවෝ :—

(1) ..............................

(2) ..............................

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| අප්‍රේල් | 70. 4. 3 සිකුරාද | 70. 3.25 බදද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | 70. 4. 8 බදද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | 70. 5. 8 සිකුරාද | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |

1970 මාර්තු 5 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.